*සැ. යු.-* 2017.01.06 දින පළ වූ අංක 2001 දරන ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,004 - 2017 ජනවාරි මස 27 වැනි සිකුරාදා - 2017.01.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සැම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 102 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 106 |

සැ. යු. - අවලංගු කළ නොහැකි තෑගි ඔප්පු බලවත් අකෘතඥතාවය පදනම් කොටගෙන අවලංගු කිරීමේ පනත් කෙටුම්පත 2017 ජනවාරි මස 20 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සැම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සැම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සැම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2017 පෙබරවාරි මස 17 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 පෙබරවාරි මස 03 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

99- B 81137 — 5,403 (2017/01)

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

- (i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
- (ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
- (iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
- (iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
- (v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
- (vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්ලටින් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පෙ-ාතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙ-වත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලා-වකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩද-ාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෙ-ා්ජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑලි, අඩි-කෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරී-මෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේ-වකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

## තනතුරු - ඇබෑර්තු

### ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවේ ශිල්පීය අංශයේ නාවිකයින් සඳහා පුරප්පාඩු

1. ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදවේ ශිල්පීය අංශයේ ආධුනික නාවික ශිල්පීන් සඳහා පුරප්පාඩු පවතී.

2. පහත සඳහන් සුදුසුකම් ඇති පිරිමි අපේක්ෂකයන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදවට බැඳීමට පහත සඳහන් පොදු කොන්දේසි අනිවාර්යයෙන්ම සපුරාලිය යුතුය.

| | | | |
|---|---|---|---|
| (අ) | පුරවැසිභාවය | - | ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුයි. |
| (ආ) | වයස | - | 2017 පෙබරවාරි මස 28 වැනි දිනට අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 24 ට නොවැඩි විය යුතුයි. |
| (ඇ) | උස | - | සෙ. මී. 160 ට නොඅඩු විය යුතුයි. |
| (ඇ) | බර | - | කි. ග්‍රෑ 47 ට නොඅඩු විය යුතුයි. |
| (ඉ) | පපුව | - | සෙ. මී. 76 ට නොඅඩු විය යුතුයි. |
| (ඊ) | වර්ණ දෘෂ්ටිය | - | එස්ටීඩී II |
| (උ) | දෘෂ්ටි තීක්ෂණත්වය | - | වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස් සහ කාච රහිතව) |
| (ඌ) | සිවිල් තත්වය | - | අයදුම්කරුවන් අවිවාහක විය යුතුයි. කිසිම ආධුනිකයෙකුට පුහුණුව ලබන කාලයේදී සහ බල නැව් තරාතිරමට සුදුසුකම් ලබන තුරු විවාහ ගිවිස ගැනීමට අවසර දෙනු නොලැබේ. |

3. අධ්‍යාපන සුදුසුකම් ඃ

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය මගින් පිරිනමනු ලබන තුන්අවුරුදු පූර්ණ කාලීන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව සඳහා පහත සඳහන් අංශයන් වෙත බඳවා ගනු ලැබේ.

(1) නාවික ඉංජිනේරු අංශය(එන්ජින් කාමර ශිල්පී අංශය සඳහා)
(2) විදුලි ඉංජිනේරු අංශය(විදුලි ශිල්පී අංශය සඳහා)
(3) විද්‍යුත් හා විදුලි සංදේශ ඉංජිනේරු අංශය(ගුවන් විදුලි විද්‍යුත් ශිල්පී අංශය සඳහා)
(4) මෝටර් රථ ඉංජිනේරු අංශය(මෝටර් රථ ශිල්පී අංශය සඳහා)
(5) නැව් තැනීම් ඉංජිනේරු අංශය(නැව්බඳ කාර්මික ශිල්පී අංශය සඳහා)

මෙම අංශයන් වෙත ඇතුල්වීමේ සුදුසුකම් අපොස(සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනකදී අවම වශයෙන් ගණිතය විෂයට සම්මාන සාමාර්ථයක්ද, ඉංග්‍රීසි භාෂාව සහ විද්‍යාව යන විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන්ද සහිතව විෂයයන් 06 ක් සමත් වී තිබිය යුතුය. තවද අපොස (උ/පෙළ) විභාගයෙන් එක් වරකදී සංයුක්ත ගණිතය සහ භෞතික විද්‍යාව විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයන්ද සහිතව සමත් වී තිබිය යුතුය. (විභාග කොමසාරිස් ජෙනරාල්වරයා විසින් නිකුත් කළ ප්‍රතිඵල ලේඛනයේ සහතික කල පිටපතක් අයදුම්පත සමග අමුණා එවිය යුතුය.)

*සටහන*.-අපොස (සා/පෙළ) අධ්‍යාපන සුදුසුකම් සඳහා අතිරේක විෂයයන් සලකනු නොලැබේ.

4. ක්‍රීඩා ක්ෂේත්‍රයේ ලබාගත් විශිෂ්ඨ දක්ෂතා ගැන නිසි ලෙස සලකා බලනු ලැබේ.

5. ඉහත සඳහන් 2 සහ 3 ඡේදයන්හි දක්වා ඇති අවශ්‍යතාවයන් සපුරාලනු නොලබන අපේක්ෂකයින්ගේ ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. පළමු සම්මුඛ පරීක්ෂණයට පැමිණි විට උස, ඇස් පෙනීම හා බර පරීක්ෂාව කරනු ලැබේ. *ගැසට් පත්‍රයේ* ඉල්ලා ඇති මිමි වලට අනුව උස, ඇස් පෙනීම හා බර නොමැති අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කරනු නොලැබේ. යම් අයදුම්කරුවකුගේ උස නියමිත පරිදි නොමැති වුවද හමුද සේවයට ප්‍රයෝජනවත් වන විශේෂ නිපුණතාවයක් ඇත්නම් නාවික හමුදාධිපතිගේ අනුමැතිය පරිදි ඔහු ගැන සලකා බලනු ලැබේ.

6. සේවා කොන්දේසිඃ

(අ) අපේක්ෂකයින් ආධුනිකයින් වශයෙන් බඳවා ගනු ලබන අතර ඔවුන් මූලික පුහුණුවීමේ පාඨමාලාවන් හැදෑරිය යුතු වේ.

(ආ) ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස් පරිදි නාවික හමුදාධිපති විසින් තීරණය කරනු ලබන පරිදි ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක හෝ විදේශයක පුහුණුවක් ලැබීම සඳහා ආධුනිකයින් සූදානමින් සිටිය යුතුය.

(ඇ) පුහුණුව ලබන කාල සීමාව තුළදී හා ඉන් පසුව ආධුනිකයින් නාවික හමුද නීතියට යටත් විය යුතුය.

(ඇ) සෑම ආධුනිකයෙකුටම සියලුම ආයිත්තම් සහිත නිල ඇඳුම් උපකරණ සහ වෛද්‍ය පහසුකම් සපයනු ලැබේ.

(ඉ) පුහුණුව ලබන කාලසීමාව තුළ ආධුනිකයින්හට නවාතැන් පහසුකම් හා නාවික හමුද භෝජනාගාරය තුළින් ආහාර සපයනු ලැබේ.

(ඊ) පුහුණුවන කාලසීමාව තුළ දී යම් ආධුනිකයෙකු හට තම අපේක්ෂකත්වය සිය කැමැත්තෙන් අත්හිටුවා ගැනීමට අවශ්‍ය වුවහොත් ශ්‍රී ලංකා ජනරජය මගින් එම ආධුනිකයා වෙනුවෙන් එතෙක් දරා ඇති සියලුම වියදම් එම ආධුනිකයා විසින් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවිය යුතුවේ.

(උ) පුහුණුව ලබන කාලසීමාව තුළ ඕනෑම අවස්ථාවකදී යම්කිසි ආධුනිකයෙකුගේ නොමනා හැසිරීම මත හෝ ඔහු විසින් වගකිව යුතු කිසියම් හේතුවක් මත හෝ ඔහු නාවික හමුදවේ සේවය සඳහා යෝග්‍ය නොවේ යැයි වගකිව යුත්තන් විසින් තීරණය කරන ලද්දේ නම් එම අවස්ථාවේදීම අදල ආධුනිකයා විසින් එතෙක් ඔහු

වෙනුවෙන් දරා ඇති සියලුම වියදම් ශ්‍රී ලංකා නාවික හමුදාවට ආපසු ගෙවීමට එකඟ වන බවට ශ්‍රී ලංකා ජනරජයේ නියෝජිතයා වශයෙන් නාවික හමුදාධිපති සමග බැඳුම්කරයකට ඇතුළත් විය යුතු ය.

(ඌ) ශාරීරික යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන් පමණක් එදිනම මූලික සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරන අතර, එහිදී එම අයදුම්කරුවන් ලිඛිත සහ වාචික පරීක්ෂණයක් සඳහා යොමු කරනු ලබයි. එම පරීක්ෂණයේදී ලබා ගන්නා ලද ලකුණු සහ පවත්නා ඇබෑර්තු සංඛ්‍යාව මත ඒ ඒ අංශයෙන් වැඩිම ලකුණු ලබාගත් අයදුම්කරුවන් පමණක් බඳවා ගැනීම් සඳහා කැඳවනු ලබයි.

(එ) සියලුම නාවිකයින් රාජකාරී හෝ පුහුණුවීම් සඳහා ඕනෑම අවස්ථාවකදී ලෝකයේ ඕනෑම ප්‍රදේශයකට අනුයුක්ත කරනු ලැබීමට යටත් වේ.

(ඒ) සියලුම නාවිකයින් නාවික නීතිය මගින් පාලනය කරනු ලැබේ.

7. රාජ්‍ය භාෂා පිළිබඳ අවශ්‍යතා.-තෝරාගනු ලබන අපේක්ෂකයින් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස දැනට පනවා ඇති හා මින් ඉදිරියට පනවනු ලබන නියෝග හා ව්‍යවස්ථාවන් පිළිපැදිය යුතුවේ.

8. වැටුප් හා දීමනා :

2016.01.01 දින සිට ගෙවීම් කරනු ලබන්නේ කළමනාකරණ සේවා චක්‍රලේඛ 03/2016 අනුව වේ. ඒ අනුව

| | | |
|---|---|---|
| (අ) | මූලික වැටුප | - රු.17,684.00 |
| (ආ) | ජීවන වියදම් දීමනාව | - රු. 7,800.00 |
| (ඇ) | නිළ ඇඳුම් පිරිසිදු කිරීමේ දීමනාව | - රු. 170.00 |
| (ඈ) | දුෂ්කර දීමනාව (මෙහෙයුම් ප්‍රදේශ සඳහා) | - මූලික පුහුණුවෙන් පසු හිමි වේ. |
| (ඉ) | දුෂ්කර දීමනාව (මෙහෙයුම් නොවන ප්‍රදේශ සඳහා) | - මූලික පුහුණුවෙන් පසු හිමි වේ. |
| (ඊ) | අනෙකුත් දීමනා | - විශේෂ දීමනාව රු. 1,000.00 |
| | | - විශේෂ අමතර දීමනාව රු.2,400.00 |
| (උ) | ගැළපුම් දීමනාව | - රු. 9,822.00 |
| | සම්පූර්ණ වැටුප අවම වශයෙන් | - රු. 38,876.00 |

*සටහන.*-නාවිකයාගේ මූලික වැටුප 2020.01.01 දිනට රු.30,140.00 වන අතර, *පහත පරිදි වැටුප් වර්ධකයන්* හිමි වේ.

2016.01.01 - 176 x 5-210 x 19
2020.01.01 - 300 x 5-370 x 19

(ඌ) නොමිලේ දුම්රිය ගමන් කළහැකි දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් වසරකට (අදාල පරිදි නාවිකයාට, කලත්‍රයාට ළමයින්ට හා යැපෙන්නන්ට) හිමිවනු ලැබේ.

(එ) කඳවුර තුළ වාසය කරන නාවිකයින්ට මසකට වරක් නිවස්නයේ සිට තම නිවසට යාමට සහ ඒමට අතිරේක දුම්රිය ගමන් බලපත්‍ර කට්ටලයක් හෝ බස් ගාස්තු ගෙවනු ලැබේ.

(ඒ) නිළ ඇඳුම් සහ ඊට අදාල අනෙකුත් භාණ්ඩ නොමිලයේ සපයනු ලැබේ.

(ඔ) නොමිලේ වෛද්‍ය පහසුකම් සපයනු ලැබේ.(අදාල පරිදි නාවිකයාට, කලත්‍රයාට ළමයින්ට හා යැපෙන්නන්ට)

(ඕ) රජයේ නිවාසයක වාසය නොකරන විවාහක නාවිකයින්ට රු.1,600.00 සිට රු.4,250.00 දක්වා ගෙවල් කුලී දීමනාවන් හිමිවේ.

(ක) විවාහක නාවිකයින් සඳහා විවාහක නිවස්නයෙහි පුරප්පාඩු මත නිවාස සැපයේ. මේ සඳහා ගෙවල් කුළිය රාජ්‍ය සේවකයින්ට අදල පරිදි අයකරනු ලැබේ.

9. අයදුම්කරුවන්ට උපදෙස් :

(අ) පහත දැක්වෙන ආකෘතියට අනුව ඉල්ලුම්පතෙහි සියලුම ඡේදයන් හැකි පමණ විස්තර සහිතව හා පැහැදිලිව තම අත් අකුරින් සම්පූර්ණ කළ යුතුයි. ඉල්ලුම්පත් 2017 පෙබරවාරි මස 28 වැනි දින දහවල් 1200 ට ප්‍රථම ලැබෙන සේ "ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිළධාරී (බඳවා ගැනීම්), නාවික හමුද මූලස්ථානය, තැ. පෙ. 593, කොළඹ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියාපදිංචි තැපෑලෙන් නොලැබෙන අයදුම්පත් බාරගනු නොලැබේ. ඉල්ලුම්පත් බහාලන කවරයේ වම් ඉහළ කෙළවරේ "ආධුනික නාවික ශිල්පීන් බඳවා ගැනීම" යනුවෙන් සටහන් කළ යුතුයි. ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට හා වේලාවට පසුව ලැබෙන අයදුම්පත් සහ මෙම නිවේදනයේ අවශ්‍යතාවයන්ට අනුකූල නොවූ අයදුම්පත් භාරගනු නොලැබේ.

මේ පිළිබඳ වැඩිදුර විස්තර www.navy.lk වෙබ් අඩවියෙන් හෝ දුරකථන අංක 011-2215162 මඟින් ලබාගත හැක.

(ආ) රාජ්‍ය සේවයේ /සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතනයන්හි සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් අපේක්ෂකයා තෝරාගත හොත් නිදහස් කළහැකි බවට සහතිකයක්ද සහිතව දෙපාර්තමේන්තුවේ/සංස්ථාවේ/මණ්ඩලයේ/ආයතනයේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුයි.

(ඇ) සම්මුඛ පරීක්ෂණයන්ට හෝ වෙනයම් අවස්ථාවක කැඳවනු ලැබූ විට අපේක්ෂකයින් පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය. :—

(1) උප්පැන්න සහතිකය,

(2) අයදුම්කර ඇති අංශයන්වලට අදාළ අධ්‍යාපන සුදුසුකම් ඇති බව සනාථ කිරීමට අධ්‍යාපන සහතික,

(3) පාසල් හැරයාමේ සහතිකය.

(4) මාස 06ක් ඇතුලත ලබාගත් ග්‍රාම නිලධාරි සහතිකය.

(5) පිළිගත් ආයතනයකින් ලබාගත් වෘත්තීය/කාර්මික හෝ පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ සහතික,

(6) මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක්, මින් එකක් අවසන් වරට තමා ඉගෙනුම ලැබූ පාසලේ ප්‍රධානාචාර්යතුමාගෙන් විය යුතු අතර, අනෙක අවුරුදු දෙකකට වැඩි කාලයක් අයදුම්කරු ගැන දැන සිටි වගකිව යුතු පුද්ගලයෙකුගෙන් හෝ වර්තමාන සේවා යෝජකයාගෙන් (දැනට සේවයේ යෙදී ඇත්නම්) විය යුතුය,

(7) ක්‍රීඩා හා ශිෂ්‍යභට යනාදිය පිළිබඳ සහතික.

(*ඈ*) නියම කරන ලද අවස්ථාවන්හි දී මෙම ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි අපේක්ෂකයින්ගේ ඉල්ලුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

(*ඉ*) කිසිම වෙනත් ලියකියවිලි හෝ මුල් පිටපත් කිසිවක් අයදුම්පත් සමග නොඑවිය යුතුය.

(*ඊ*) අයදුම්පත සමග සහතිකවල මුල් පිටපත් එවා, එම සහතික නැති වුවහොත් නාවික හමුදාව ඊට වගකියනු නොලැබේ.

10. ඉල්ලුම්පතෙහි අසත්‍ය ප්‍රකාශයන් කර තිබී, එම අසත්‍යතාවය අපේක්ෂකයා තෝරා ගැනීමට ප්‍රථම හෙළිදරව් වුවහොත් ඔහුගේ අපේක්ෂකත්වය අහිමි කිරීමට ද, තෝරාගැනීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු සේවයෙන් පහ කිරීමට ද යටත් වේ.

11. තෝරා ගැනීමේ/සම්මුඛ පරීක්ෂණ ආදිය :

(*අ*) ඉහත අවශ්‍යතාවයන් සපුරාලන අපේක්ෂකයින් සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් පවත්වනු ලබන මූලික වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් විය යුතුය. එම පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පමණක් පහත සඳහන් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සමත් විය යුතුය. ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සමත්වන අපේක්ෂකයින්ට තේරීම් මණ්ඩලයක් ඉදිරිපිට සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිටීමට සිදු වන්නේය.

(*ආ*) ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සමත්වීම සඳහා අවශ්‍යතා :

| *ව්‍යායාමය* | *වාර ගණන* | *කාලය (මිනිත්තු/තත්පර)* |
|---|---|---|
| මීටර් 2400 දිවීම | - | මිනිත්තු 11 හෝ ඊට අඩු |
| Push up | 20 හෝ ඊට වැඩි | මිනිත්තු 02 |
| Sit up | 15 හෝ ඊට වැඩි | මිනිත්තු 02 |
| Arm Bending | 07 හෝ ඊට වැඩි | - |

(*ඇ*) සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයින් හට පරීක්ෂණ පවත්වන දිනය, වේලාව හා ස්ථානය ඔවුන් දක්වා ඇති ලිපිනයට ලිඛිතව තැපැල් මගින් දැනුම් දෙනු ලැබේ. සම්මුඛ පරීක්ෂණවලට සහභාගි වීම සම්බන්ධයෙන් ගමන් වියදම් හෝ වෙනත් කිසිම වියදමක් ගෙවනු නොලැබේ.

(*ඈ*) මෙම තනතුර සම්බන්ධයෙන් අයදුම්කරුවෙකු කැඳවනු ලබන සෑම අවස්ථාවකදී ම පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත ඔහු විසින් ඉදිරිපත් කළ යුතු ය.

(*ඉ*) අවසාන සම්මුඛ පරීක්ෂණයෙන් පසුව සුදුස්සන් විය හැකි අපේක්ෂකයන් නාවික හමුදා වෛද්‍ය මණ්ඩලයක් ඉදිරියේ පෙනී සිටිය යුතු ය.

(*ඊ*) අපේක්ෂකයෙකු නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුව ද එසේ කළ යුත්තේ ඔහුට සහතිකයක් දීමෙනි. අපේක්ෂකයෙකු තෝරා ගැනීම සඳහා කවරාකාරයකින් හෝ පෙළඹවීම් නැතහොත් බලපෑම් කිරීමට උත්සාහ කිරීම, අපේක්ෂකයා නුසුදුසු අයෙක් වීමට හේතු වන්නේ ය.

(*උ*) බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අපේක්ෂකයින්ට ඒ බව දන්වා සිටිනු නොලැබේ.

**සටහන** - මෙම *ගැසට්* නිවේදනය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන්ම පළවන අතර සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

ආර්. සී. විජේගුණරත්න,
ඩබ්වී, ආර්ඩබ්පී* ආර්එස්පී, වීඑස්වී,
යූඑස්පී, එන්ඩීසී, පීඑස්එන්
වයිස් අද්මිරාල්,
නාවික හමුදාධිපති.

නාවික හමුද මූලස්ථානය,
තැ. පෙ. 593,
කොළඹ 01.

**ශ්‍රී ලංකා නිත්‍ය නාවික හමුදාවේ ශිල්පීය අංශයේ ආධුනික නාවිකයින් සඳහා ඉල්ලුම්පත**

1. පුරවැසිභාවය :————.
(ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පෙළපතින් ද, ලියාපදිංචි වීමෙන් ද, යන්න සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන් නම් එම සහතික පත්‍රයේ දිනය සහ අංකය සඳහන් කරන්න.)

2. ඉල්ලුම් කරන අංශය (ප්‍රමුඛතාවය අනුව) :————.

3. සම්පූර්ණ නම (ජාතික හැඳුනුම්පතට අනුව) :————.

4. ජාතික හැඳුනුම්පත් අංකය :————.

5. ස්ථිර ලිපිනය :————.

6. තැපැල් ලිපිනය :————.

7. උපන් දිනය :————.

8. වයස ඃ අවුරුදු :———. මාස :———. දින :———.
(2017 පෙබරවාරි මස 28 දිනට)

9. උස ........... (සෙ. මී.) පපුව ........... (සෙ. මී.)
බර : ............ (කි. ග්‍රෑ.)

10. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය :————.

11. දිස්ත්‍රික්කය:————.

12. ඡන්ද කොට්ඨාසය :————.

13. ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————.

14. දුරකථන අංකය :————.

15. විවාහක හෝ අවිවාහක බව :————.

16. ස්ත්‍රී පුරුෂ භාවය :————.

17. අධ්‍යාපනය ලැබූ පාසල :————.

18. පාසල සහ/හෝ විශ්වවිද්‍යාල පිළිබඳ විස්තර :

| පාසලේ/විශ්ව විද්‍යාලයේ නම | සමත් විභාගය | විභාගයට පෙනී සිටි වර්ෂය | සමත් වූ විෂයයන් (ශ්‍රේණි ඇතුලුව) |
|---|---|---|---|
| | අ.පො.ස. (සා.පෙළ) : | | |
| | අ.පො.ස. (උ.පෙළ) : | | |
| | වෙනත් | | |

19. පාසලෙන්/විශ්වවිද්‍යාලයෙන් ඉවත් වූ පසු කළ රැකියා පිළිබඳ විස්තර :

| *සේවා යෝජකයාගේ නම සහ ලිපිනය* | *රැකියාවේ ස්වභාවය* | *සේවා කාලය* | |
|---|---|---|---|
| | | *සිට* | *දක්වා* |
| | | | |

20. මව්පියන් පිළිබඳ විස්තර :

| | *සම්පූර්ණ නම* | *උපන් ස්ථානය* | *රැකියාව* | *වර්තමාන ලිපිනය* |
|---|---|---|---|---|
| පියා : | | | | |
| මව : | | | | |

21. තනතුර සඳහා ඇති විශේෂ සුදුසුකම් :————.

22. ක්‍රීඩා අතින් දැනට පවත්නා විශිෂ්ටතා පිළිබඳ විස්තර (ඔබ සහභාගි වූ තරග සහ ක්‍රීඩා කණ්ඩායම්, දිනයන් හා ලැබූ විශිෂ්ටතා දක්වන්න.) :————.

23. පාසලේ දී, විශ්වවිද්‍යාලයේ දී හෝ බාහිර සංවිධානවල දී දක්වා ඇති වෙනත් විශිෂ්ටතා (දිනයන් සමග විස්තර දක්වන්න) :————.

24. සන්නද්ධ සේවා හෝ ස්වේච්ඡා බල සේනාවේ හෝ ශිෂ්‍යභට බලකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයේ ඇති සේවය :———.

25. ශ්‍රී ලංකා නාවික හමුදාවට හෝ සන්නද්ධ හමුදා කිසිවකට හෝ පොලීසියට හෝ බැඳීම සඳහා ඔබ විසින් මීට පෙර ඉල්ලීම් කර තිබේ ද ? එසේ නම්, ඒ පිළිබඳ විස්තර සහ ඒ ඉල්ලීම්වලට සිදුවූයේ කුමක්දැයි සඳහන් කරන්න :————.

26. සිවිල් හෝ යුධ අධිකරණයක දී වැරදිකරු කර හෝ ඇප බැඳ තිබේ ද? එසේ නම් විස්තර සඳහන් කරන්න :————.

27. රජයේ දෙපාර්තමේන්තුවක හෝ රාජ්‍ය අංශයෙහි/මණ්ඩලයක/ සංස්ථාවක (මහ බැංකු, ජාතික බැංකු, විශ්වවිද්‍යාල, රජය විසින් පාලනය කරන සිවිල් ව්‍යාපාර, සමාගම් ආදිය ඇතුළුව) සේවයෙහි යෙදී සිටියේ නම් එහි සේවය අවසන් කිරීමට හේතු :————.

28. චරිත සහතික පිළිබඳ විස්තර :

| *නම* | *පදවිය* | *තැපැල් ලිපිනය* |
|---|---|---|
| | | |

29. *අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය ඃ*

පූර්වෝක්ත ප්‍රකාශවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ වූ ශ්‍රී ලංකා නාවික හමුදාවේ ශිල්පීය අංශය සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියා පිළිවෙළ හා ඒ අයට අදාළ වන ව්‍යවස්ථා ද මම කියවා අවබෝධ කර ගතිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

01-816

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

### වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව

### වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ, වන ව්‍යාප්ති නිලධාරී තනතුරට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2016 (2017)

වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ, වන ව්‍යාප්ති නිලධාරී තනතුරුවලට බඳවා ගැනීමට සුදුසුකම් ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙම අයදුම්පත් එවීමේදී 2015.05.15 දින රජයේ *ගැසට් පත්‍රයේ* පළකරන ලද දැන්වීමට අනුව අයදුම්පත් එවන ලද අපේක්ෂකයින් මෙම විභාගය සඳහා පෙනීසිටීමට සුදුසුකම් ලබන අතර ඔවුන් නැවත අයදුම් කිරීම අවශ්‍ය නොවේ.

1. වැටුප් ක්‍රමය :

(i) පුහුණු කිරීමේ ශ්‍රේණිය: MN:1- 2016 රා.ප.ච.ලේඛ 3/2016 අනුව
රු. 27,140-10x300-11x350-10x495-10x660 - රු. 45,540

2. සේවයේ අනුයුක්ත කරවීමේ පොදු නියමයන් හා සේවා කොන්දේසි :

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

(ii) පත්වීම අවු. 03ක පරිවාස කාලයකට යටත් වේ.

(iii) වන ව්‍යාප්ති නිලධාරීන්, දෙපාර්තමේන්තුව මගින් ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබන විවිධ සංවර්ධන වැඩසටහන් සම්බන්ධීකරණය කොට ජනතා සහභාගිත්වයෙන් වඩාත් කාර්යක්ෂමව හා සාර්ථකව පවත්වාගෙන යාම කළ යුතු ය.

(iv) වන ව්‍යාප්ති නිලධාරීන්ගේ සේවා ස්ථාන දිවයිනේ වනගත ප්‍රදේශවල පිහිටි, දුෂ්කර සේවා ස්ථාන වන අතර තෝරා ගනු ලබන අපේක්ෂකයින් දිවයිනේ නියෝග කරනු ලබන ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සූදානම්ව සිටිය යුතු ය.

(v) *ගැසට් පත්‍රයේ* 2 ඡේදයෙහි පළ කර ඇති රාජ්‍ය සේවයේ තනතුරුවලට පත් කිරීමේදී අදාළ වන පොදු කොන්දේසි අදාළ වේ.

(vi) විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පැවැත්වේ. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

3. *වයස් සීමාව* : ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට අවු. 18ට නොඅඩු සහ අවු. 30ට නොවැඩි විය යුතුය.

4. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* - සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් සුදුසුකම් සතුටුදායක ලෙස සම්පූර්ණ කර තිබිය යුතුය. :

(i) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් එක් වරක දී සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ විද්‍යාව ඇතුළුව විෂයයන් හතරකට සම්මාන සහිතව විෂයයන් හයක් සමත් වී තිබිය යුතුය.

(ii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී අවම වශයෙන් විෂයයන් එකක් (01) (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් වී තිබිය යුතුය.

(iii) වෘත්තීය සුදුසුකම් - ක්ෂේත්‍රයේ ලබා ඇති සුදුසුකම් විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

(iv) අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු අතර විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

(v) සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

5. *බඳවා ගැනීමේ ක්‍රමය* :

(i) ඉහත 4 ඡේදය යටතේ සුදුසුකම් ලබන, ලිඛිත පරීක්ෂණයකින් සියලුම විෂයයන් සමත් අයදුම්කරුවන් ලබා ගන්නා සමත් ලකුණුවල ප්‍රමුඛතාවයේ අනුපිළිවෙල මත, බඳවා ගැනීමට නියමිත සංඛ්‍යාව හා එම අපේක්ෂිත සංඛ්‍යාවෙන් 25% ප්‍රමාණයක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට ලක්කර, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී හා විභාගයේ දී ලබාගන්නා ලද මුළු ලකුණුවල ප්‍රමුඛතාවයේ අනුපිළිවෙල මත, නියමිත පුරප්පාඩු සංඛ්‍යාවට අනුරූපී ලෙස බඳවා ගනු ලැබේ.

(ii) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා පහත සඳහන් පරිදි ලකුණු ලබාදෙනු ලැබේ. :

| | *පරීක්ෂාකර ලකුණු ලබා දෙනු ලබන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 1. | අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 30 |
| 2. | වෘත්තීය සුදුසුකම් | 30 |
| 3. | පරිගණක හැකියාව | 15 |
| 4. | භාෂා ප්‍රවීණතාවය | 20 |
| 5. | සම්මුඛ පරීක්ෂණයේ දී දක්වනු ලබන කුසලතාවය | 05 |
| | මුළු ලකුණු | 100 |

(iii) ඉහත 5.1 ඡේදයේ සඳහන් පරිදි, බඳවා ගැනීමට පවත්නා අවසන් පුරප්පාඩුව සඳහා බඳවා ගැනීමේ දී, සමාන ලකුණු ලැබූ අයදුම්කරුවන් කීපදෙනෙක් සිටියහොත්, එයට ඉහළ ලකුණු ලබාගෙන ඇති අයදුම්කරුවන් පමණක් බඳවා ගනු ලැබේ.

(iv) ලිඛිත පරීක්ෂණයෙන් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගත් ලකුණුවල මුළු ලකුණු ප්‍රමුඛතාව අනුව හා පවත්නා පුරප්පාඩු සංඛ්‍යාවට අනුරූපිකව සකසන ලද ප්‍රතිඵල ලේඛනය වන සංරක්ෂක ජනරාල් වෙත ලබා දෙනු ඇත. අනතුරුව විභාගයට පෙනී සිටි අයදුම්කරුවන් සියලු දෙනා වෙත පෞද්ගලිකව ප්‍රතිඵල දැනුම්දීම විභාග කොමසාරිස් ජනරාල් විසින් තැපෑලෙන් හෝ www.results.exams.gov.lk වෙබ් අඩවිය හරහා හෝ සිදු කෙරෙනු ඇත.

(v) ඉහත 5.1 යටතේ සුදුසුකම් මත තෝරා ගනු ලබන අපේක්ෂකයින්, තනතුරට පත් වූ දින සිට වසර 05 ක් ඇතුළත, නුවරඑළිය ශ්‍රී ලංකා වන විද්‍යායතනයේ දී පවත්වනු ලබන එක් අවුරුදු න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණු පාඨමාලාවකින් අනතුරුව පැවැත්වෙන විභාගයෙන් සමත් විය යුතුය.

(vi) බාහිර අයදුම්කරුවන්ගෙන් තෝරාගනු ලබන අපේක්ෂකයින්ගෙන්, වසර 03ක පරිවාස කාලයකට යටත්ව පත්කරනු ලබන අතර, වෘක්ෂ විද්‍යා පරීක්ෂණය සමත් වීමෙන් පසුව සහ වසර 03ක සතුටුදායක සේවා කාලයකින් පසුව සේවය ස්ථිර කරනු ලැබේ.

6. *විෂය නිර්දේශය :*

ලිඛිත තරග විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විතය.

| | |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | කාලය පැය 01, ලකුණු සංඛ්‍යාව 100 |
| | සංඛ්‍යාමය හැකියාව, තර්ක ශක්තිය, සාමාන්‍ය බුද්ධිය ආදිය මැනෙන අයුරින් සැකසෙන විෂයානුබද්ධ ප්‍රශ්න වලින් සමන්විත ලිඛිත ප්‍රශ්න පත්‍රයකි. බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50කින් යුක්ත වන අතර ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. |
| පොදු ප්‍රශ්න පත්‍රය | කාලය පැය 02, ලකුණු සංඛ්‍යාව 100 |
| | වන සංරක්ෂණය, සන්නිවේදන ක්‍රම, වන ව්‍යාප්ති කටයුතු, පැල තවාන් කළමනාකරණය, වන වගාව හා ප්‍රජා සහභාගීත්ව සංවර්ධන කටයුතු පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම හා අවබෝධය මැනීම සඳහා වන එක් ප්‍රශ්න පත්‍රයකින් සමන්විතය. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. |

(i) අපේක්ෂකයින් මෙම ප්‍රශ්න පත්‍ර දෙකටම පෙනී සිටිය යුත්තේ එකම භාෂා මාධ්‍යයකිනි. සාමාර්ථ්‍යය සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට ලබා ගත යුතු අවම ලකුණු ප්‍රමාණය 40%කි.

7. අයදුම්පත් හා අනෙකුත් විස්තර

(i) මෙම නිවේදනයේ අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව, අයදුම් පත්‍රයේ අංක 01 සිට 08 තෙක් වූ ශීර්ෂ පළමුවන පිටුවට ද ඉතිරිය ඊළඟ පිටු වලටද ඇතුළත්වන පරිදි සෙ. මී. 21x29 (ඒ 4 ප්‍රමාණයේ) කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් තමන් විසින් ඉල්ලුම්පත සකස්කළ යුතු අතර, අයදුම්පත්‍රය විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කරන මාධ්‍යයෙන් තම අත් අකුරින්ම සම්පූර්ණ කළ යුතුය. ඉල්ලුම්පත බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ, වන ව්‍යාප්ති නිලධාරී තනතුරට බඳවා ගැනීම (විවෘත) - 2016 යනුවෙන් සඳහන් කර 2017.02.28 දින හෝ ඊට පෙර ලැබෙන සේ විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (පෞද්ගලික නමකට හෝ වෙනත් කිසිදු ලිපිනයකට නොඑවිය යුතුය)

(ii) අසම්පූර්ණ හෝ ප්‍රමාදවී හෝ ලැබෙන ඉල්ලුම්පත් දැන්වීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(iii) තැපෑලේ දී අස්ථානගතවන ඉල්ලුම්පත් පිළිබඳව වග කියනු නොලැබේ.

(iv) අයදුම්පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවා ද, එසේ නොවන අයදුම් කරුවෙකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියෙකු/විශ්‍රාමික නිලධාරියෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු රු. 240,360/- ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැළකිය යුතු තත්ත්වයක් දරන අයෙකු හෝ ලවා සහතික කරවා ගත යුතුය.

(v) මෙම නිවේදනයේ දැක්වෙන නියමයන්ට අනුකූල නොවන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(vi) රජයේ සේවයේ නියුතු නිලධාරීන් තම ඉල්ලුම්පත් ස්වකීය ආයතන/ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත්කළ යුතුය.

(vii) ඉල්ලුම්පත ලද බව දන්වනු නොලැබේ.

8. *විභාග ගාස්තු* :

(i) විභාග ගාස්තුව රු. 600.00 කි. එම ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 යටතේ රාජ්‍ය ආදායමට බැරවන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් හෝ උප තැපැල් කාර්යාලයකට ඉහත මුදල් ගෙවා ලබාගත් මුදල් බාර ගැනීමේ කුවිතාන්සිය / ලදුපත අයදුම්පතෙහි නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. විභාග ගාස්තුව අයදුම්පත් කැඳවනු ලබන 2017.02.28 දිනට පෙර ගෙවිය යුතුය. (එම කුවිතාන්සියේ ඡායා පිටපතක් අයදුම්කරු ළග තබා ගැනීම සුදුසුය.)

(ii) කුමන කරුණක් යටතේ වුව ද විභාග ගාස්තුව ආපසු නොගෙවන අතර වෙනත් කිසිම විභාගයක් සඳහා මාරු කිරීමට හෝ ඉඩදෙනු නොලැබේ.

9. පහත සඳහන් ලිපි ලේඛනවලින් එකක් හෝ සියල්ලම හෝ කැඳවීමක් කළ අවස්ථාවක ඉදිරිපත් කළ යුතුය.

(i) උප්පැන්න සහතිකය

(ii) අධ්‍යාපන සහතික

(iii) මෑතක දී ලබාගත් ග්‍රාම සේවා සහතිකයක් (ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිත)

(iv) චරිත සහතික දෙකක්

(v) වෙනත් අදාළ සහතික

*සැළකිය යුතුයි* - ලියකියවිලි / සහතික හෝ ඒවායේ පිටපත් ඉල්ලුම් පත්‍රය සමග එවීම නොකළ යුතුයි.

10. විභාගය මෙහි උපලේඛනය- 1හි දැක්වෙන නගරවල පිහිටවනු ලබන විභාග මධ්‍යස්ථානවල දී පැවැත්වේ. අයදුම්කරුවන් විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගර හා ඊට අදාළ අංක අයදුම්පත්‍රයේ ශීර්ෂයේ පළමු හා දෙවෙනි තේරීම වශයෙන් සඳහන් කළ යුතුය. කිසියම් නගරයක විභාග මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැතිනම් එම අයදුම්කරුවන් ඔවුන්ගේ දෙවන මනාපය ලෙස දක්වන ලද නගරයේ හෝ ආසන්න වෙනත් නගරයක හෝ පිහිටවනු ලබන විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කරනු ඇත. තව ද යෝජිත නගර සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැතිනම් විභාගය කොළඹ දී පමණක් පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කරනු ඇත.

(ii) නිවේදනයේ සඳහන් අයදුම්පත් භාරගන්නා අවසාන දිනය වන 2017.02.28 හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශපත්‍ර නිකුත්කරනු ඇත. විභාග ප්‍රවේශපත්‍ර නිකුත්කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින දෙකක් හෝ තුනක් ගතවූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවෙක් නම් එම විස්තර සමග ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබාගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමුකරමින්ම විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

(iii) අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු අතර, විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේම, තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

(iv) විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

11. *අපේක්ෂකයාගේ අනන්‍යතාව* .- විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් ඉල්ලුම්කරු තම අනන්‍යතාව ඔප්පු කළ යුතු අතර, ඒ සඳහා පහත සඳහන් ලේඛනවලින් පමණක් ඕනෑම ලේඛනයක් පිළිගනු ඇත.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් ජනරාල් විසින් නිකුත්කරන ලද ජාතික හැඳුනුම්පත.

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය

12. *සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම්* .- තෝරා ගනු ලැබීමට පෙර හෝ පසු හෝ අපේක්ෂකයෙකු අදාළ සුදුසුකම් සම්පූර්ණ කර නැති බව අනාවරණය වුවහොත්, ඕනෑම අවස්ථාවක දී ඔහුගේ අපේක්ෂකත්වය හෝ තෝරාගැනීම අවලංගු කළ හැකි අතර, අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් ඔහු එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෝ යම් වැදගත් කරුණක් ඕනෑකමින් වෙනස් කර ඇති බව හෝ ඔහුව තෝරා ගැනීමෙන් පසුව හෙළි වුවහොත් ඔහු රාජ්‍ය සේවයෙන් පහ කිරීමට යටත් වනු ඇත.

13. අවශ්‍ය අවස්ථාවක දී, මෙම නිවේදනයේ සඳහන් කර නොමැති කරුණු පිළිබඳව වන සංරක්ෂක ජනරාල් විසින් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

14. සිංහල, දෙමළ, හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

වන සංරක්ෂක ජනරාල්
වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

*වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වන ව්‍යාප්ති නිලධාරි තනතුරට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2016 (2017)*

## Open Competitive Examination for Recruitment to the Post of Forest Extension Officer of the Forest Department - 2016

විභාගයට පෙනී සිටින නගරය

| | නගරය | නගර අංකය |
|---|---|---|
| පළමු තේරීම | | |
| දෙවන තේරීම | | |

(උපලේඛනය - 1 අනුව සම්පූර්ණ කරන්න)

01. විභාගයට පෙනී සිටින මාධ්‍යය ෑ
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

02. (i) මුලකුරු අගට යොදා මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
(උදා. GUNAWARDHANA M.G.B.S.K.)
(ii) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :———.
(iii) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

03. (i) ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය ( ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
:————.

(ii) ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

04. ස්ත්‍රී/ පුරුෂ භාවය :

පුරුෂ - 0
ස්ත්‍රී - 1 ☐

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

05. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

06. (i) උපන් දිනය :

අවුරුද්ද ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

(ii) 2017.02.28 දිනට වයස :

අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

07. පුරවැසි භාවය :
පරම්පරාවෙන් - 1 ☐

ලියාපදිංචි වීමෙන් - 2

(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

08. දුරකථන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

09. අධ්‍යාපන සුදුසුකම් :

(i) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය :

1 වන වර

වර්ෂය............ විභාග අංකය............

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| | |
| | |
| | |

2 වන වර

වර්ෂය........... විභාග අංකය...........

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| | |
| | |
| | |

II. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය :
වර්ෂය...................... විභාග අංකය..............................

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| | |
| | |
| | |

10. වෙනත් අධ්‍යාපන සුදුසුකම් :————.

11. වෘත්තීය සුදුසුකම් :————.

12. (i) විභාග ගාස්තු ගෙවූ තැපැල් කාර්යාලය :————.
(ii) ලදුපත් අංකය හා දිනය :————.

කුවිතාන්සිය නොගැලවෙන පරිදි මෙහි අලවන්න

13. (i) ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් දඬුවම් ලබා තිබේද? ඔව්/නැත
(ii) ඔව් නම් විස්තර සඳහන් කරන්න :————.

14. ඔබ දැනට රැකියාවක් කරන්නේ නම් ඒ පිළිබඳ විස්තර :
(i) ආයතනය :————.
(ii) මුල්පත්වීම් දිනය :————.
(iii) තනතුර :————.
(iv) වැටුප :————.

15. ඔබ ගැන තොරතුරු සැපයිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් සඳහන් කරන්න :

(i) ————.
(ii) ————.

16. අයදුම්කරුගේ ප්‍රකාශය :

මෙම අයදුම්පතේ මවිසින් සපයන ලද තොරතුරු සත්‍ය බවට ද, නිවැරදි බවට ද මම සහතික කරමි.මෙහි ඇතුළත් වූ තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මා තෝරාගැනීමට පෙර අනාවරණය වුවහොත් මාගේ අයදුම්පත අවලංගු වීමට යටත් බව හා පත්වීම් ලැබීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් වන්දියක් නොමැතිව සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවද මම දනිමි. තව ද විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත්වන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන,
(අත්සන සහතික කරන්නා ඉදිරියේදී අත්සන යෙදිය යුතුය).

දිනය :————.

17. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරනු ලබන ............................................................... මහතා / මහත්මිය / මෙනවිය / මා පෞද්ගලිකව දන්නා බව ද, ඔහු/ඇය මා ඉදිරිපිටදී 2017.................................... වැනි දින ඔහුගේ / ඇයගේ අත්සන තැබූ බව ද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද, එම ලදුපත අලවා ඇති බව ද. සහතික කරමි.

————,
සහතික කරන අයගේ අත්සන.

සහතික කරන නිලධාරියාගේ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
දිනය :————.
(නිල මුද්‍රාව තබන්න)

18. අයදුම්කරු රජයේ සේවකයෙකු නම්, දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් මෙම කොටස සම්පූර්ණ කළ යුතුය.

මෙම අයදුම්පත ඉදිරිපත් කරන.................................. මහතා/ මහත්මිය/ මෙනවිය මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ කාර්යාලයේ ස්ථිර/ තාවකාලික තනතුරක් දරන බවත්, නිලධාරියාගේ පෞද්ගලික ලිපි ගොණුව හා අනෙකුත් අදාළ ලේඛන අනුව ඔහු

/ ඇය සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, සහතික කරමි. ඔහු හෝ ඇය මෙම තනතුරු සඳහා තෝරා ගනු ලැබුවහොත්, මෙම දෙපාර්තමේන්තුවේ දැනට දරන තනතුරින් මුදා හැරිය හැකි/නොහැකි බවද මෙයින් දන්වා සිටිමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පැවරූ
නිලධාරියාගේ අත්සන.

නම :————.
තනතුර :————.
(මුද්‍රාව තබන්න)
දිනය :————.
(අනවශ්‍ය වචන කපා හරින්න)

*සැ.යු.* - ඉල්ලුම් පත්‍රය සමග මුදල් ගෙවා තබා ගත් කුවිතාන්සිය / ලදුපත හැර වෙනත් කිසිදු ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ ඇමිණිය යුතු නැත.

### උපලේඛනය - I

විභාග මධ්‍යස්ථාන පිහිටුවන නගර හා නගර අංක :

| *නගරය* | *නගර අංක* |
|---|---|
| කොළඹ | 01 |
| ගම්පහ | 02 |
| කළුතර | 03 |
| මහනුවර | 04 |
| මාතලේ | 05 |
| නුවරඑළිය | 06 |
| ගාල්ල | 07 |
| මාතර | 08 |
| හම්බන්තොට | 09 |
| යාපනය | 10 |
| මන්නාරම | 11 |
| වව්නියාව | 12 |
| මුලතිව් | 13 |
| කිලිනොච්චිය | 14 |
| මඩකලපුව | 15 |
| අම්පාර | 16 |
| ත්‍රිකුණාමලය | 17 |
| කුරුණෑගල | 18 |
| පුත්තලම | 19 |
| අනුරාධපුරය | 20 |
| පොළොන්නරුව | 21 |
| බදුල්ල | 22 |
| මොණරාගල | 23 |
| රත්නපුර | 24 |
| කෑගල්ල | 25 |

01-920

## උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය

## ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනය

### උසස් තාක්‍ෂණ ආයතන සහ ආයතන අංශ සඳහා සිසුන් ඇතුළත් කිරීම - 2017 අධ්‍යයන වර්ෂය

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) මගින් මෙහෙයවන උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලා සඳහා 2016 වර්ෂයේ හෝ ඊට පෙර වර්ෂවල අ.පො.ස. (උ. පෙළ) සමත් අදාළ සුදුසුකම් ඇති අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

*අයදුම්පත් :*

ආදර්ශ අයදුම්පත්‍රයට අනුව සකස්කර ගන්නා ලද අයදුම් පත්‍රයක් ඉංග්‍රීසියෙන් සම්පූර්ණ කර රුපියල් පන්සියයක (රු. 500) මුදලක් ඕනෑම මහජන බැංකු ශාඛාවක් මගින් අංක 025-2-001-1-3397613 දරන ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතන ගිණුමට බැරකොට ලබාගන්නා ලද කුවිතාන්සිය අයදුම්පතේ අලවා ඔබගේ අයදුම්පත ඔබ තෝරා ගත් පාඨමාලා පැවැත්වෙන උසස් තාක්‍ෂණ ආයතනයට හෝ උසස් තාක්‍ෂණ ආයතන අංශයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියුම් කවරයෙහි වම් පස ඉහළ කෙළවරෙහි ඔබ විසින් අයදුම් කරනු ලබන පාඨමාලාවේ නම සඳහන් කළ යුතුය. එක් ආයතනයකට වඩා අයදුම් කරන්නේ නම් අයදුම් කරනු ලබන සෑම අයදුම් පත්‍රයක් සඳහාම වෙන වෙනම රුපියල් පන්සියයක (රු. 500) වටිනාකමකින් යුත් කුවිතාන්සිය අයදුම්පත්‍රයේ අදළ කොටුව තුළ අලවා අයදුම්පත් ඉදිරිපත්කළ යුතුය. උක්ත අංක දරන ගිණුමට හැර වෙනත් බැංකු ගිණුමකට බැරකරන ලද කුවිතාන්සි සහිත අයදුම්පත් හා අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්‍ෂේප කෙරේ.

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට 2017.02.28 පසු ලැබෙන අයදුම්පත් ප්‍රතික්‍ෂේප කරනු ලැබේ.

"ආ" කොටසෙහි ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනයට අයත් උසස් තාක්‍ෂණ ආයතන/ආයතන අංශවල පවත්වනු ලබන පාඨමාලා හා ලිපිනයන් දක්වා ඇති අතර, අයදුම්කරුවන් තම සුදුසුකම් හා සරිලන පාඨමාලා තෝරාගත යුත්තේ "අ" කොටසෙහි සඳහන් පාඨමාලා ලැයිස්තුව තුළිනි.

*දේශන පැවැත්වෙන ආකාරය :*

පූර්ණකාලීන පාඨමාලා සඳහා දේශන සතියේ දිනවල දිවා කාලයේ ද, අර්ධකාලීන පාඨමාලා සඳහා දේශන සති අන්තයේ දිවා කාලයේ ද පැවැත්වේ. සියලුම පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් පැවැත්වේ. අර්ධකාලීන පාඨමාලා අදාළ ක්ෂේත්‍රයේ රැකියාවන්හි නියුක්ත අයට පමණක් සීමා කෙරේ.

*පාඨමාලා ගාස්තු :*

පූර්ණ කාලීන (Full Time) පාඨමාලා සඳහා ගාස්තු අය කරනු නොලැබේ. අර්ධකාලීන (Part-time) පාඨමාලා සඳහා සමාසික ගාස්තු (Semester) පහත පරිදි වේ. :

| | |
|---|---|
| උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා - උ. ජා. ග. ඩි. | රු. 5,000 |
| උසස් ජාතික ඉංග්‍රීසි පිළිබඳ ඩිප්ලෝමා - උ. ජා. ඉ. ඩි. | රු. 8,000 |
| උසස් ජාතික තොරතුරු තාක්‍ෂණ ඩිප්ලෝමා - උ. ජා. තො. තා. ඩි. | රු. 12,000 |

*සම්මුඛ පරීක්ෂණය :*

සුදුසුකම් අනුව තෝරාගත් අයදුම්කරුවන් අභියෝග්‍යතා පරීක්ෂණයකට හා/හෝ සම්මුඛ පරීක්‍ෂණයකට පෙනී සිටිය යුතු ය. ශිෂ්‍යයන් තෝරා ගැනීම මූලිකව උසස් පෙළ විභාගයේ දී ලබාගත් ඒකාබද්ධ ලකුණු හෝ Z-Score මත පදනම් වේ. සම්මුඛ පරීක්‍ෂණය සඳහා දිනය, වේලාව, ස්ථානය හා ඉදිරිපත් කළ යුතු ලිපි ලේඛන ආදී විස්තර අදාළ ආයතන ප්‍රධානීන් විසින් ලිපියකින් පෞද්ගලිකව දන්වා එවනු ඇත. අවශ්‍ය මුල් පිටපත් සම්මුඛ පරීක්‍ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය. සහතිකවල මුල් පිටපත් නොමැති අවස්ථාවල දී සහතික කරන ලද ඡායා පිටපත්, ලියාපදිංචි වීමේ දී මුල් පිටපත් ඉදිරිපත් කරන කොන්දේසිය යටතේ භාරගනු ලැබේ.

නේවාසික පහසුකම් :

දෙහිවල හා ගම්පහ උසස් තාක්ෂණ ආයතනවල සීමිත කාන්තා නේවාසිකාගාර පහසුකම් සහ අම්පාර හාඩි උසස් තාක්‍ෂණ ආයතනයේ හා කොළඹ උසස් තාක්‍ෂණ ආයතනයන්හි සීමිත කාන්තා/පිරිමි නේවාසිකාගාර පහසුකම් ඇත. මෙම සීමිත පහසුකම් ලබාදෙනුයේ පූර්ණ කාලීන පාඨමාලා සඳහා ලියාපදිංචි වූ සුදුසුකම්ලත් සිසුන්හට පමණි.

එක් එක් පාඨමාලාවන් සඳහා ඇතුළත්වීමට අවශ්‍ය සුදුසුකම් :

### "අ" කොටස

01. **1 උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා - උ. ජා. ග. ඩි. (පූර්ණ කාලීන) - කාලය වසර 4 යි.**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් අතුරෙන් එකක් සපුරා තිබිය යුතු ය :

(i) අ. පො. ස. (උ/පෙළ) විභාගය යටතේ ව්‍යාපාර සංඛ්‍යානය හෝ සංයුක්ත ගණිතය හෝ ගිණුම්කරණය විෂයය ඇතුළත්ව විෂයයන් තුනම එක්වරක දී සාමාර්ථය ලබා තිබීම, මෙම විෂයයන් තුනෙන් විෂයයන් දෙකකට සම්මාන ලබා තිබිය යුතු ය.

අ. පො. ස. (උ./පෙළ) විභාගයේ දී ව්‍යාපාර සංඛ්‍යානය හෝ සංයුක්ත ගණිතය හෝ ගිණුම්කරණය විෂයයන්ට සම්මාන සාමාර්ථයක් ලබා නැත්නම් අ. පො. ස. (සා. පෙ.) විභාගයේ දී ගණිතය විෂයයට සම්මාන සාමාර්ථයක් ලබා තිබිය යුතු ය.;

හෝ

(ii) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ගණක ශිල්පීය ජාතික සහතිකය සමත්වීම;

සහ

අ. පො. ස. (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබිය යුතු ය.

**01. 2. උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා - උ. ජා. ග. ඩි. (අර්ධ කාලීන) - කාලය වසර 4 යි.**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් අතුරෙන් එකක් සපුරා තිබිය යුතුය. :

(i) අ. පො. ස. (උ/පෙළ) විභාගය (පැරණි නිර්දේශය) යටතේ එක් අවස්ථාවක දී විෂයයන් හතරකින් හෝ (නව නිර්දේශය) යටතේ එක් අවස්ථාවක දී ඕනෑම විෂයයන් තුනකින් සමත් වී තිබීම.

(ii) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ගණක ශිල්පීය ජාතික සහතිකය සමාර්ථයක් ලබා තිබීම.

(iii) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ව්‍යාපාර අධ්‍යයන ජාතික සහතිකය (ගණකාධිකරණය) සාමාර්ථයක් ලබා තිබීම හෝ ගණකාධිකරණය පිළිබඳ ජාතික සහතිකය සාමාර්ථයක් ලබා තිබීම.

*සැලකිය යුතුයි*.— අයදුම්කරු රජයේ, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ රැකියාවක නිරතව සිටින අයෙකු විය යුතු ය.

පහත සඳහන් සුදුසුකම් දරන්නන් උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාවේ ප්‍රථම වසරින් නිදහස් කර එම පාඨමාලාවේ II වසරට බඳවා ගැනීම සෙසු අවශ්‍යතාවන් සපුරාලීමේ හා ඉඩකඩ තිබීමේ කොන්දේසියට යටත්ව අනුමත කර ඇත.

(i) ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය මගින් හෝ කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ව්‍යාපාර අධ්‍යයන පිළිබඳ ජාතික ඩිප්ලෝමාව/ව්‍යාපාර මුල්‍ය සමත්ව තිබීම;

(ii) ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය මගින් පවත්වනු ලබන උසස් ජාතික ව්‍යාපාර පරිපාලනය/ව්‍යාපාර මුල්‍ය/කළමනාකරණ ඩිප්ලෝමාව සමත්ව තිබීම;

(iii) ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය මගින් හෝ කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන උසස් ජාතික වාණිජ ඩිප්ලෝමාවේ දෙවන වසර සමත්ව තිබීම;

(iv) අදාළ ක්ෂේත්‍රයේ විශ්වවිද්‍යාල උපාධිය (ගණකාධිකරණ/ ව්‍යාපාර පරිපාලන/අලෙවි කළමනාකරණ/ මානව සම්පත් කළමනාකරණ/ ව්‍යාපාර මුල්‍ය/ව්‍යාපාර ආර්ථික විද්‍යා);

(v) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ මධ්‍ය පරීක්‍ෂණය සමත්ව තිබීම;

(vi) වරලත් කළමනාකාරිත්ව ගණකාධිකරණ ආයතනයේ I සහ II පරීක්‍ෂණය සමත්ව තිබීම;

(vii) ශ්‍රී ලංකා ගිණුම්කරණ ශිල්පීය ආයතනයේ III අදියර පරීක්‍ෂණය සමත්ව තිබීම;

(viii) සහතිකලත් කළමණාකරණ ගණකාධිකාරි ආයතනයේ අවසාන විභාගය සමත්ව තිබීම.

**02. උසස් ජාතික ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමා - උ. ජා. ව්‍යා. ප. ඩි. (පූර්ණ කාලීන) — කාලය වසර 2 1/2 යි.**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් අතුරෙන් එකක් සපුරා තිබිය යුතුය. :-

(i) අ. පො. ස. (උ/පෙළ) විභාගය ගණිතය, ජීව විද්‍යාව හා වාණිජ්‍යය විෂය ධාරාවෙන් එක් වරකදී සමත්වීම ;

*හෝ*

(ii) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ගණක ශිල්පීන් සඳහා වූ ජාතික සහතිකය සාමාර්ථයක් ලබා තිබීම;

සහ

අ. පො. ස. (සා/පෙළ) විභාගය සඳහා ඉංග්‍රීසි භාෂාව විෂයයට හා ගණිතය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**03. උසස් ජාතික ව්‍යාපාර මුල්‍ය ඩිප්ලෝමා- උ. ජා. ව. මු. ඩි. - (පූර්ණ කාලීන) - කාලය වසර 2 1/2 යි**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් අතුරෙන් එකක් සපුරා තිබිය යුතු ය :-

(i) අ.පො.ස. (උ.පෙළ) විභාගය ගණිතය හෝ වාණිජ්‍ය විෂය ධාරාවෙන් එක් වරක දී සමත්වීම;

*හෝ*

(ii) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව මගින් පවත්වන ගණකාධිකරණ ජාතික සහතික පත්‍ර විභාගය සමත් වී තිබීම;

*සහ*

අ.පො.ස. (සා.පෙළ.) විභාගය සඳහා ඉංග්‍රීසි භාෂාව විෂයයට හා ගණිතය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**04. උසස් ජාතික ගොඩනැගිලි සේවා ඉංජිනේරු ඩිප්ලෝමා - (උ. ජා.ගො.සේ.ඉ.ඩි) (පූර්ණ කාලීන) - කාලය වසර 3 1/2 යි.**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය. :-

(i) අ. පො. ස. (උ/පෙළ) ගණිතය විෂය ධාරාව යටතේ විෂයයන් තුනම එක වරකදී සමත්ව තිබීම; සහ අ. පො. ස. (සා/පෙළ) ඉංග්‍රීසි භාෂාව සඳහා සාමාර්ථය ලබා තිබීම.

**05. උසස් ජාතික පාරිභෝගික විද්‍යාව හා නිපැයුම් තාක්ෂණ ඩිප්ලෝමා - උ.ජා.පා.වි.නි.තා.ඩි - (පූර්ණ කාලීන) - කාලය වසර 2 1/2 යි**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතු ය :-

(i) ඕනෑම විෂය ධාරාවකින් අ. පො. ස. (උ/පෙළ) විභාගය එක් වරකදී සියළුම විෂයයන්ගෙන් සමත්වීම ;

*සහ*

අ. පො. ස. (සා/පෙළ) විභාගයේදී ගණිතය හා ඉංග්‍රීසි භාෂාවට සාමාර්ථයක් ලබා තිබීම.

**06. උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා (උ. ජා. ඉ. ඩි.) - සිවිල් (පූර්ණ කාලීන) - කාලය වසර 3 1/2යි.**

**උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා (උ. ජා. ඉ. ඩි.) - විදුලි (පූර්ණ කාලීන) - කාලය වසර 3 1/2 යි.**

**උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා (උ. ජා. ඉ. ඩි.) - යාන්ත්‍රික (පූර්ණ කාලීන) - කාලය වසර 3 1/2 යි**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතු ය :-

(i) අ. පො. ස. (උ/පෙළ) ගණිතය විෂය ධාරාව යටතේ විෂයයන් තුනම එක් වරකදී සමත්ව තිබීම ;

*සහ*

අ. පො. ස. (සා/පෙළ) ඉංග්‍රීසි භාෂාව සඳහා සාමාර්ථයක් ලබා තිබීම.

**07. උසස් ජාතික ඉංග්‍රීසි පිළිබඳ ඩිප්ලෝමා - උ.ජා.ඉ.ඩි. (පූර්ණ කාලීන 2 1/2/අර්ධ කාලීන - කාලය වසර 2 1/2 යි.)**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් අතුරින් එකක් සපුරා තිබිය යුතු ය. :-

(i) අ. පො. ස. (උ/පෙළ) විභාගය ඕනෑම විෂය ධාරාවකින් එක්වරක දී සමත්ව වී තිබීම සහ අ. පො. ස. (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි සාහිත්‍ය හෝ ඉංග්‍රීසි භාෂාව විෂයය සඳහා "C" සාමාර්ථයක් ලබා තිබීම;

*හෝ*

(ii) ඉංග්‍රීසි (විශේෂ) ගුරු පුහුණු සහතිකය හෝ විද්‍යා පීඨ ඩිප්ලෝමා සහතිකය (ඉංග්‍රීසි);

*හෝ*

(iii) අ. පො. ස. (උ/පෙළ) විභාගය සමත්ව තිබීම සහ කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන වාණිජ කර්මාන්ත සහ වැඩිදුර අධ්‍යාපනය සඳහා වන ඉංග්‍රීසි පිළිබඳ ජාතික සහතික පත්‍ර විභාගයෙන් සාමාර්ථය ලබා තිබීම හෝ සමාන සුදුසුකම් ලබා තිබීම.

**08. උසස් ජාතික ආහාර තාක්ෂණ ඩිප්ලෝමා - උ.ජා.ආ.තා.තා. ඩි. (පූර්ණ කාලීන) - කාලය වසර 2 1/2**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතු ය :-

(i) අ.පො.ස. (උ.පෙළ) විභාගය ජීව විද්‍යාව හෝ භෞතික විද්‍යාව විෂයය ධාරාවන් යටතේ විෂයයන් තුනම එක් වරක දී සමත් ව තිබිය යුතු ය;

*සහ*

අ. පො. ස. (සා. පෙළ.) විභාගයෙන් ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය විෂය සඳහා සාමාර්ථයක් ලබා තිබීම.

**09. උසස් ජාතික තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමා - උ. ජා. තො. තා. ඩි. (පූර්ණ කාලීන - කාලය වසර 2 1/2යි)/ අර්ධ කාලීන - කාලය වසර 2 1/2යි)**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතු ය. :-

(i) අ. පො. ස. (උ/පෙළ) විභාගය ඕනෑම විෂය ධාරාවකින් එක් වරක දී සමත්ව තිබීම ;

*සහ*

අ.පො.ස. (සා.පෙළ.) විභාගය සඳහා ඉංග්‍රීසි භාෂාව විෂයයට හා ගණිතය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**10. උසස් ජාතික කළමනාකරණ ඩිප්ලෝමා - උ. ජා. ක. ඩි. (පූර්ණ කාලීන) - (කාලය වසර 3 කි).**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් අතුරින් එකක් සපුරා තිබිය යුතු ය. :-

(i) ඕනෑම විෂය ධාරාවකින් අ. පො. ස. (උ/පෙළ) විභාගය එක් වරක දී සමත්ව තිබීම;

*හෝ*

(ii) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීම් දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ගණක ශිල්පීන් සඳහා වූ ජාතික සහතික පත්‍රය හෝ රාජ්‍ය පරිපාලනය හෝ අලෙවිකරණය සඳහා වූ ව්‍යාපාර අධ්‍යයන ජාතික සහතිකය සමත්වීම;

*සහ*

අ.පො.ස. (සා.පෙළ.) විභාගයේදී ගණිතය හා ඉංග්‍රීසි භාෂාවට සාමාර්ථයක් ලබා තිබීම.

**11. උසස් ජාතික ප්‍රමාණ හා මිනුම් සමීක්ෂණ ඩිප්ලෝමා (පූර්ණ කාලීන) - (උ. ජා. ප්‍ර. මි. ස. ඩි.) - කාලය වසර 2 1/2යි**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතු ය. :-

(i) අ. පො. ස. (උ/පෙළ) ගණිතය විෂය ධාරාව යටතේ විෂයයන් තුනම එක්වරකදී සමත්ව තිබීම;

*සහ*

අ.පො.ස. (සා.පෙළ.) ඉංග්‍රීසි භාෂාව සඳහා සාමාර්ථයක් ලබා තිබීම.

**12. උසස් ජාතික තාක්ෂණික ඩිප්ලෝමා (කෘෂිකර්මය) - (උ. ජා. තා. ඩි. (කෘෂි) (පූර්ණ කාලීන) - කාලය වසර 3 යි.**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතු ය :-

(i) එක් වතාවක දී අ.පො.ස. (උ./පෙළ.) විභාගය යටතේ ජීව විද්‍යා අංශයෙන්, රසායන විද්‍යාව, කෘෂි විද්‍යාව, ජීව විද්‍යාව, භෞතික විද්‍යාව යන විෂයයන්ගෙන් දෙකක් සහිතව විෂයයන් තුනකින් සමත්වී තිබීම;

*සහ*

(ii) අ.පො.ස. (සා./පෙළ.) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව විෂයයට හා ගණිතය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**13. උසස් ජාතික සංචාරක හා සත්කාරක කළමනාකරණ ඩිප්ලෝමා - උ.ජා.ස.ස.ක.ඩි. (පූර්ණ කාලීන) කාලය වසර 3 යි.**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් අතුරෙන් එකක් සපුරා තිබිය යුතු ය. :-

(i) ඕනෑම විෂය ධාරාවකින් අ. පො. ස. (උ/පෙළ) විභාගය එක් වරකදී සියලුම විෂයයන්ගෙන් සමත්වීම;

*හෝ*

(ii) කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීම් දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ගණක ශිල්පීන් සඳහා වූ ජාතික සහතික පත්‍රය හෝ රාජ්‍ය පරිපාලනය හෝ අලෙවිකරණය සඳහා වූ ව්‍යාපාර අධ්‍යයන ජාතික සහතිකය සමත්වීම;

*සහ*

අ.පො.ස. (සා. පෙළ.) විභාගයේදී ගණිතය හා ඉංග්‍රීසි භාෂාවට සාමාර්ථයක් ලබා තිබීම.

සැලකිය යුතුයි.-

- අර්ධ කාලීන අයදුම්කරුවන් අදාල ක්ෂේත්‍රය සම්බන්ධ රැකියාවක නිරත විය යුතුය.
- පූර්ණ කාලීන පාඨමාලා සඳහා අවම වශයෙන් මාස හයක (6) පුහුණු පාඨමාලා ඇතුලත් වී ඇත.
- අර්ධ කාලීන පාඨමාලා සඳහා අවම වශයෙන් මාස හයක (6) ව්‍යාපෘති වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.

"ආ" කොටස

**උසස් තාක්ෂණ ආයතන/උසස් තාක්ෂණ ආයතන අංශ, ලිපිනයන්, දුරකථන අංක හා පවත්වන පාඨමාලා :**

| සංකේත අංකය | ආයතන/ආයතන අංශය | ලිපිනයන් | දුරකථන අංක | පවත්වන පාඨමාලාවන් |
|---|---|---|---|---|
| 01 | හාඩි උසස් තාක්ෂණ ආයතනය, අම්පාර | ඉඟිනියාගල පාර, අම්පාර | 063-2222056<br>063-2223035 | උ. ජා. ග. ඩි. (පූ. කා.), උ. ජා. ග. ඩි. (අ. කා.) උ. ජා. ක. ඩි. උ. ජා. තො. තා. ඩි. (පූ. කා.), උ. ජා. තා. ඩි. (කෘෂි), උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (අ. කා.) උ. ජා. ස. ස. ක. ඩි. |
| 02 | උසස් තාක්ෂණ ආයතන අංශය, අනුරාධපුරය | අක්කර 111,<br>අනුලා මාවත, පණ්ඩුලගම,<br>අනුරාධපුරය | 025-2234417 | උ. ජා. ග. ඩි. (පූ. කා), උ. ජා. ග. ඩි. (අ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.) උ. ජා. ඉංග්‍රීසි ඩි.(අ. කා.) උ. ජා. තො. තා. ඩි. (පූ. කා.), උ. ජා. තො. තා. ඩි. (අ. කා), උ. ජා. ස. ස. ක. ඩි. |
| 03 | උසස් තාක්ෂණ ආයතනය, බදුල්ල | ග්‍රීන්ලන්ඩ් ඩ්‍රයිව්, බදුල්ල | 055-2230218<br>055-2223818 | උ. ජා. ග. ඩි. (පූ. කා.), උ. ජා. ග. ඩි. (අ. කා.), උ. ජා. ක. ඩි. උ. ජා. තො. තා. ඩි. (පූ. කා.) උ. ජා. තො. තා. ඩි. (අ. කා), උ. ජා. ඉංග්‍රීසි. ඩි. (පූ. කා.), (උ. ජා. ඉංග්‍රීසි ඩි. (අ. කා.) උජා. ස. ස. ක. ඩි. |
| 04 | උසස් තාක්ෂණ ආයතන අංශය, මඩකලපුව | ප්‍රධාන වීදිය,<br>කෝවිල් කුලම් නැගෙනහිර,<br>අරයාම්පති | 065-2247519 | උ. ජා. ග. ඩි. (පූ. කා.) උ. ජා. ග. ඩි. (අ. කා.) උජා. ඉංග්‍රීසි ඩි. (අ. කා) උ. ජා. තො. තා. ඩි. (පූ. කා), උ. ජා. තො. තා. ඩි. (අ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩී. (පූ. කා.), උ. ජා. ස. ස. ක. ඩි. |
| 05 | උසස් තාක්ෂණ ආයතනය. කොළඹ | අංක 42, රොද්‍රිගු පෙදෙස කොළඹ 15. | 011-2521152<br>011-2521282 | උ. ජා. ඉ. ඩි. (සිවිල්/යාන්ත්‍රික/විදුලි ඉංජිනේරු), උ. ජා. ප්‍ර. මි. ස. ඩි,<br>උ. ජා. ගො. සේ. ඉ. ඩි. |
| 06 | උසස් තාක්ෂණ ආයතනය, දෙහිවල | අංක 51 වෛද්‍ය පාර,<br>දෙහිවල | 011-2738349 | උ. ජා. ග. ඩි (පූ. කා.), උ. ජා. ග. ඩි. (අ. කා.) උ. ජා. ක. ඩි., උ. ජා. ව්‍යා. ප. ඩි. උ. ජා. තො. තා. ඩි. (පූ. කා), උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (අ. කා.), උ. ජා. ව්‍යා. මු. ඩි.<br>උ. ජා. ස. ස. ක. ඩි. |
| 07 | ගාල්ල උසස් තාක්ෂණ ආයතනය, ගාල්ල | සිරිධම්ම මාවත,<br>ලබුදූව, අක්මීමන | 091-2246179 | උ. ජා. ඉ. ඩි. (සිවිල්/යාන්ත්‍රික/විදුලි ඉංජිනේරු), උ. ජා. ග. ඩි. (පූ. කා.) උ. ජා. ග. ඩි. (අ. කා.) උ. ජා. ක. ඩි. උ. ජා. ව්‍යා. ප. ඩි., උ. ජා. තො. තා. ඩි. (පූ. කා.), උ. ජා. තො. තා. ඩි, (අ. කා.), උ. ජා. තා. ඩි. (කෘෂි), උ. ජා. ඉංග්‍රීසි ඩී. (පූ. කා.), උ. ජා, ඉංග්‍රීසි ඩී. (අ. කා.), උ. ජා. ප්‍ර. මි. ස. ඩි., උ. ජා. ස. ස. ක. ඩි |

| සංකේත අංකය | ආයතන/ආයතන අංශය | ලිපිනයන් | දුරකථන අංක | පවත්වන පාඨමාලාවන් |
|---|---|---|---|---|
| 08 | උසස් තාක්‍ෂණ ආයතනය, ගම්පහ | නයිවල, එස්සැල්ල, වේයන්ගොඩ | 033-2287519<br>033-2292544 | උ. ජා. ග. ඩි. (පූ. කා.) උ. ජා. ග. ඩි. (අ. කා.) උ. ජා. තො. තා. ඩි. (පූ. කා.) උ. ජා. තො. තා. ඩි.<br>(අ.කා.), උ. ජා. තා. ඩි. (කෘෂි) උ. ජා. ආ. තා. ඩි,. උ. ජා. පා. වි. නි. තා. ඩි. |
| 09 | උසස් තාක්‍ෂණ ආයතනය, යාපනය | අංක 665/2 වෙරළ පාර, යාපනය | 021-2222595<br>021-2229803 | උ. ජා. ඉ. ඩි. (සිවිල්/විදුලි ඉංජිනේරු), උ. ජා. ග. ඩි. (පූ. කා.) උ. ජා. ග. ඩි. (අ. කා.) උ. ජා. ක. ඩි. උ. ජා. තො. තා. ඩි. (පූ. කා.), උ. ජා. තො. තා. ඩි. (අ.කා.) උ. ජා. ඉංග්‍රීසි. ඩි. (පු. කා.), උජා. ඉංග්‍රීසි ඩි. (අ.කා) උ. ජා ස.ස.ක.ඩි. (පු.කා.) |
| 10 | උසස් තාක්‍ෂණ ආයතනය, මහනුවර | අංක 16, කැප්පෙටිපොල පාර, මහනුවර | 081-2226644 | උ. ජා. ග. ඩි. (පූ. කා.), උ. ජා. ග. ඩි. (අ. කා.), උ. ජා. ක. ඩි., උ.ජා. ව්‍යා. ප. ඩි, උ. ජා. තො. තා. ඩි. (පූ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.) උ. ජා. ඉංග්‍රීසි ඩි (අ. කා.) උ. ජා. ස. ස. ක.ඩි. |
| 11 | කෑගල්ල උසස් තාක්‍ෂණ ආයතනය, කෑගල්ල | බංඩාරනායක මාවත, කෑගල්ල | 035-2221297<br>035-2221713 | උ. ජා. ග. ඩි. (පූ. කා.), උ. ජා. ග. ඩි. (අ. කා.) උ. ජා. තො. තා. ඩි. (පූ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.) උ. ජා. ඉංග්‍රීසි ඩි. (අ. කා.) |
| 12 | උසස් තාක්‍ෂණ ආයතනය, කුරුණෑගල | අංක 22/1, විල්ගොඩ පාර, කුරුණෑගල | 037-2229583<br>037-2224911 | උ. ජා. ග. ඩි. (පූ. කා.), උ. ජා. ග. ඩි. (අ. කා,), උ. ජා. ක. ඩි., උ. ජා. තො. තා. ඩි. (පූ. කා.), උ. ජා. තො. තා. ඩි. (අ. කා.) උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (අ. කා.), උ. ජා. ස. ස. ක. ඩි. |
| 13 | උසස් තාක්‍ෂණ ආයතනය අංශය, මන්නාරම | ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය,<br>320, ජනවතු පියස,<br>ටී. බී. ජයා මාවත,<br>කොළඹ 10. | 0112691307 | උ. ජා. ඉංග්‍රීසි ඩී. (පූ. කා.), උ. ජා. ස. ස. ක.ඩි, උජා. ව්‍යා. ප. ඩි. |
| 14 | උසස් තාක්ෂණ ආයතන අංශය, මොනරාගල | ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය<br>320, ජනවතු පියස,<br>ටී. බී. ජයා මාවත,<br>කොළඹ 10 | 0112691307 | උ. ජා. ඉංග්‍රීසි ඩී. (පූ. කා.), උ. ජා. ස. ස. ක.ඩි, උජා. ව්‍යා. ප. ඩි. |
| 15 | උසස් තාක්ෂණ ආයතන අංශය, නාවලපිටිය | පරණ නගර සභා ගොඩනැගිල්ල<br>නාවලපිටිය | 054-2050634 | උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩී. (අ. කා.) උ. ජා. ස. ස. ක. ඩි, උ. ජා. ක. ඩි. |
| 16 | උසස් තාක්‍ෂණ ආයතනය, රත්නපුරය | නව නගරය, රත්නපුරය | 045-2231492<br>045-2231493 | උ. ජා. ග. ඩි (අ. කා), උ. ජා. ග. ඩි. (පූ. කා.) උ. ජා. ඉංග්‍රීසි ඩී. (පූ. කා.) උ. ජා. ඉංග්‍රීසි ඩී (අ. කා.) උ. ජා. තො. තා. ඩි. (පූ. කා.) උ. ජා. තො. තා. ඩී. (අ. කා.) |

| සංකේත අංකය | ආයතන/ආයතන අංශය | ලිපිනයන් | දුරකථන අංක | පවත්වන පාඨමාලාවන් |
|---|---|---|---|---|
| 17 | උසස් තාක්‍ෂණ ආයතන අංශය, සමන්තුරේ | මහ වීදිය, සමන්තුරේ | 067-2261304 | උ. ජා. ග. ඩි. (පූ. කා) උ. ජා. ග. ඩි. (අ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.) උ. ජා. ඉංග්‍රීසි ඩි (අ. කා.) උ. ජා. තො. තා. ඩි.(පූ. කා.) |
| 18 | උසස් තාක්‍ෂණ ආයතනය තංගල්ල | යායවත්ත, නෙටොල්පිටිය, තංගල්ල | 0472241845<br>0472241846 | උ. ජා. ග. ඩි (අ. කා), උ. ජා. ග. ඩි. (පූ. කා.) උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.) උ, ජා. ඉංග්‍රීසි ඩි. (අ. කා.) උ. ජා. තො. තා. ඩි. (පූ. කා.) |
| 19 | උසස් තාක්‍ෂණ ආයතනය, ත්‍රිකුණාමලය | කන්නියා පාර, වරෝධය නගර්, ත්‍රිකුණාමලය | 026-2223232<br>026-2050617 | උ. ජා. ග. ඩි. (පූ. කා.), උ. ජා. ග. ඩි. (අ. කා,), උ. ජා. තො. තා. ඩි. (පූ. කා.) උ. ජා. තො. තා. ඩි. (උ.ජා.අ.කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (පූ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩි. (අ. කා.), උ. ජා. ස. ස. ක. ඩි. |
| 20 | උසස් තාක්‍ෂණ ආයතනය, වවුනියාව | ඒ 9 පාර, වේපන්කුලම් ඔමාන්තායි වවුනියාව. | 024-2052733 | උ. ජා. ග. ඩි. (පූ. කා.), උ. ජා. ග. ඩි. (අ. කා.) උ. ජා. ඉංග්‍රීසි ඩී. (පූ. කා.), උ. ජා. ඉංග්‍රීසි ඩී. (අ. කා.), උ. ජා. තො. තා. ඩි. (පූ. කා.) |

*සැළකිය යුතුයි :*

(1) උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමා, උසස් ජාතික ප්‍රමාණ හා මිනුම් සමීක්‍ෂණ ඩිප්ලෝමා, උසස් ජාතික ගොඩනැගිලි සේවා ඉංජිනේරු ඩිප්ලෝමා (පූර්ණ කාලීන) පාඨමාලාවන් සඳහා අයදුම්කරුවන් සතියේ දිනයන්හි පාඨමාලාවන් සඳහා සහභාගි වීමට නිදහස් විය යුතු අතර, සති අන්තයේ දී ද අවශ්‍යතා අනුව පාඨමාලා කටයුතුවලට සහභාගි වීමට හැකි විය යුතු ය.

(2) උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා (පූර්ණකාලීන) පාඨමාලාවේ දේශන පළමු සහ දෙවන වසර සතියේ දිනවල දිවා කාලයේ ද, තෙවන, සිව්වන වසර සති අන්තයේ ද පවත්වනු ඇත.

(3) උසස් ජාතික කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාවේ (පූර්ණකාලීන) දේශන පළමු හා දෙවන වසර සතියේ දිනවල දිවා කාලයේ දී ද, තෙවන වසර සඳහා සති අන්තයේ දී පවත්වනු ඇත.

(4) අ.පො.ස. (උ.පෙළ) නව නිර්දේශය යටතේ අයදුම්කරන්නන් සාමාන්‍ය පොදු පරීක්ෂණය සමත්ව තිබීම අනිවාර්ය වේ.

(5) අදාළ පාඨමාලාවන්ට තෝරා ගැනීමේ දී අ.පො.ස. (උ.පෙළ.) හෝ Z-Score සැළකිල්ලට ගනු ලැබේ.

(6) සුදුසුකම් ලද විභාගයේ දී පාඨමාලාවට අදාළ විෂයයන්ගෙන්/විෂයය ක්ෂේත්‍රයේ සාමාර්ථයක් ලත් අය කෙරෙහි වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.

(7) පූර්ණකාලීන පාඨමාලාව සඳහා වයස අවු. 23ට අඩු අය කෙරෙහි වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.

(8) උසස් තාක්‍ෂණ ආයතන අංශයක ඕනෑම පාඨමාලාවක් පැවැත්වීම සඳහා අවම වශයෙන් අයදුම්කරුවන් 50ක් ලියාපදිංචි වීම අනිවාර්ය විය යුතුවේ.

(9) අදාළ උසස් තාක්‍ෂණ ආයතනයක හෝ ආයතන අංශයක පැවැත්වෙන පාඨමාලාවක් සඳහා නියමිත ශිෂ්‍ය සංඛ්‍යාව ඉක්මවා යන අයදුම්පත් ප්‍රමාණයක් වේ නම්, එම ආයතන විසින් පවත්වන යෝග්‍යතා පරීක්‍ෂණයක් මගින් නියමිත ශිෂ්‍ය සංඛ්‍යා බඳවා ගනු ලැබේ.

(10) කුමන හේතුවක් නිසා හෝ තෝරා ගැනීමෙන් පසු පූර්ණ කාලීන සිසුන් අදාළ පාඨමාලාව හැදෑරීම සඳහා වෙනත් උසස් තාක්‍ෂණ ආයතනයකට හෝ ආයතන අංශයකට මාරු කරනු නොලැබේ.

(11) ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනයේ අවුරුදු 03ක් හෝ ඊට වැඩි කාලයක පාඨමාලාවකට ලියාපදිංචි වන ශිෂ්‍යයෙකුට විශ්ව විද්‍යාල ප්‍රවේශයට අයදුම් කිරීමට හැකිවන පරිදි තම ලියාපදිංචිය, ලියාපදිංචි වීමට අදාළ ආයතනය විසින් දී ඇති අවසාන දින සිට **දින 60ක කාලයක්** ඇතුළත අවලංගු කිරීමට ඉඩ ලබාදිය හැකි ය.

ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනයට 2017 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්‍ෂ ජනරාල්වරයාගේ තීරණය අවසාන තීරණය වේ.

අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2017.02.28 වේ.

Web site : www.sliate.ac.lk

ආචාර්ය ඩබ්ලිව්. හිලරි ඊ. සිල්වා,
අධ්‍යක්‍ෂ ජනරාල්,
ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනය.

*Office use only –* Course Number :.........................................

*Specimen Application Form*

**SRI LANKA INSTITUTE OF ADVANCED TECHNOLOGICAL EDUCATION**

***Application form for admission to Higher National Diploma Courses in Year — 2017***

*Name of the Courses in the Order of Preference*

1. .......................................................................
2. .......................................................................
3. .......................................................................

1. Name with initials :————.

2. Name/Names denoted by Initials :————.

3. Postal Address :————.

4. Date of Birth : Year :————., Month :————., Date :————.

   Age (as at 28.02.2017) : Years :————., Months :————., Days :————.

5. National Identity Card No. :————.

6. E-mail Address :————.

7. Sex : ————.

8. Administrative District :————. Contact Phone Number :————.

9. (i) Results of G. C. E. (Advanced Level) Examination :

   Year :————, Index No. :————. Medium :————.

| *Subjects* | *Grade* |
|---|---|
| 1. ..................................... | ..................................... |
| 2. ..................................... | ..................................... |
| 3. ..................................... | ..................................... |

Common General paper : Pass/Fail

Aggregate/Z-score of the above examination :————.

(ii) Results of G. C. E. (Ordinary Level) Examination :

Year :————. Index No.:————. Medium :————.

| *Subjects* | *Grade* | *Subjects* | *Grade* |
|---|---|---|---|
| 1. ...................................... | .................................. | 6. ...................................... | ...................................... |
| 2. ...................................... | .................................. | 7. ...................................... | ...................................... |
| 3. ...................................... | .................................. | 8. ...................................... | ...................................... |
| 4. ...................................... | .................................. | 9. ...................................... | ...................................... |
| 5. ...................................... | .................................. | 10. ...................................... | ...................................... |

10. Highest Qualification in English as a subject :————.

11. Only for part-time Courses
Details of Present Employment :

Post :————.
E. P. F. Number :————.
Place of Work and Address :————.
Date of Appointment :————.

I , do hereby declare that I am not following any other full-time course of study in any other state institution. I am aware that my registration will be cancelled at any time during the period of study if it is found that, I concurrently follow a full-time course at any other state institution. I do hereby certify that the information furnished here is true and accurate to the best of my knowledge.

————,
Signature of Applicant.

Date :————.

(The bank receipt for Rs. 500 payable to SLIATE should be Affixed below)

| |
|---|
| Affix the Bank SLIP for the amount of Rs. 500 (credited to the SLIATE account in the Peoples Bank<br>Name of the Bank : People's Bank<br>Branch : Hyde Park Corner Branch, Colombo 02<br>Account No. : 025-2-001-1-3397613 |

01-838

## වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය

### වාරිමාර්ග දෙපාර්තමේන්තුව

### වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙහි පුරප්පාඩුව පවත්නා ශ්‍රී ලංකා තාක්ෂණ සේවයෙහි තනතුරුවලට බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විවෘත තරග විභාගය - 2016

1.0 වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙහි පුරප්පාඩුව පවත්නා ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට පැවැත්වෙන විවෘත තරග විභාගය සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1.1 බඳවා ගැනීමට අපේක්ෂිත තනතුරු ඃ

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | බඳවා ගන්නා ශ්‍රේණිය |
|---|---|---|---|
| 1 | සැලසුම් ශිල්පී | 41 | පුහුණු කිරීමේ ශ්‍රේණිය (එක් වසරක පුහුණුව සඳහා) |
| 2 | විදුම් සහකාර | 01 | පුහුණු කිරීමේ ශ්‍රේණිය (දෙවසරක පුහුණුව සඳහා) |
| 3 | පර්යේෂණ සහකාර (සාමාන්‍ය) | 03 | |
| 4 | සිවිල් ඉංජිනේරුමය ද්‍රව්‍ය සමීක්ෂක | 05 | |
| 5 | පාංශු ප්‍රස්ථාරක | 01 | |
| 6 | ජල විද්‍යා සහකාර | 04 | |
| 7 | ජල විද්‍යා ක්ෂේත්‍ර සහකාර | 02 | |
| 8 | පර්යේෂණ සහකාර (ඉංජිනේරුමය ද්‍රව්‍ය) | 04 | |
| 9 | පස් සමීක්ෂක | 02 | |
| 10 | පර්යේෂණ සහකාර (ජල ශක්ති) | 01 | |
| 11 | යාන්ත්‍රික මූලික | 06 | III වන ශ්‍රේණියට බඳවා ගැනේ. එහෙත් බඳවා ගැනීමෙන් අනතුරුව මුල් මාස 06 තුළ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික වැඩපලක සේවාස්ථ පුහුණුවක් ලබා දෙනු ලැබේ. |

1.2 තනතුරුවල රාජකාරී ස්වභාවය ඃ

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පැවරෙන කාර්යයන්* |
|---|---|---|
| 1. | සැලසුම් ශිල්පී | 1) ඉංජිනේරු කාර්ය මණ්ඩලය විසින් දෙනු ලබන නිර්මාණ සටහන්, මූලික පරාමිති, කෙටුම්පත් සටහන් ඇසුරෙන් විස්තරාත්මක සැලසුම්පත් පිළියෙල කිරීම/ පරීක්ෂා කිරීම : බිම් මැණුම් තලමිති මැණුම් ආශ්‍රයෙන් පිඹුරුපත්, සමෝච්ච රේඛා සිතියම්, දික්කඩ හරස්කඩ සැලසුම්පත් පිළියෙල කිරීම/පරීක්ෂා කිරීම, වාරිමාර්ග ව්‍යාපාරවල ඉඩම් කට්ටි කිරීමේ සැලසුම්පත්, ඉඩම් පවරා ගැනීමේ සැලසුම්පත්, මෙහෙයුම් නඩත්තු සැලසුම්පත් ආදිය පිළියෙල කිරීම/ පරීක්ෂා කිරීම.<br><br>2) ප්‍රමාණ ගණනය : ගාස්තු සඳහා මිල විශ්ලේෂණය : ප්‍රමාණ බිල්පත් පිළියෙල කිරීම/ පරීක්ෂා කිරීම.<br><br>3) වැඩ ඇස්තමේන්තු පරීක්ෂා කිරීම, වැඩ ඇස්තමේන්තු අනුසාරයෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලියට අදාල පෝරම, උපලේඛනය පිළියෙල කිරීම/ පරීක්ෂා කිරීම : වැඩ සඳහා ගෙවීම් කිරීමට අදාල මිනුම් පොත්, ගෙවීම් බිල්පත්, අවසන් ගෙවීම් වාර්තා හා සැලසුම්පත් පරීක්ෂා කිරීම. |

| අනු අංකය | තනතුරු නාමය | පැවරෙන කාර්යයන් |
|---|---|---|
| | | 4) වාරිමාර්ග ව්‍යාපාරවල තාක්ෂණික මෙහෙයුම් හා මනා දත්ත පිළිබඳ ලේඛන නඩත්තුව: ප්‍රගති වාර්තා /සටහන් පිළියෙල කිරීම / පරික්ෂා කිරීම.<br><br>5) සැලසුම්පත්, පිඹුරුපත් සහ අනෙකුත් සැලසුම් කාර්යාලීය ලේඛන, ද්‍රව්‍ය හා උපකරණවල භාරකාරත්වය හා නඩත්තුව.<br><br>විධායකය/ කළමණාකරණය විසින් පවරනු ලබන අනෙකුත් සැලසුම් ශිල්පීය රාජකාරි |
| 2. | විදුම් සහකාර | * මධ්‍යම හා මහා පරිමාණ ඉදිකිරීම් සඳහා භූමියේ ශක්තිමත්භාවය භූගත ජල කාන්දුවීම් ආදිය පරික්ෂා කිරීමේ කටයුතු<br>* විශාල ඉදිකිරීම්වල අත්තිවාරම් සඳහා විවිධ ගැඹුරු මට්ටම්වලින් පාෂාණ හා පස් තට්ටුවල සාම්පල ලබා ගැනීම.<br>* පාෂාණ ස්ථරවල කාන්දුවීම නැවැත්වීම හා ඒවා ශක්තිමත් කිරීමට අවශ්‍ය කටයුතු කිරීම.<br>* නිම කරන ලද ඉදිකිරීම් වල සිමෙන්ති හා රසායනික ද්‍රව්‍ය කාවැද්දීම මගින් ද මතුපිට යන්ත්‍ර මඟින් කොන්ක්‍රීට් ආස්තරණ යෙදීම මඟින් ද ජල කාන්දුවීම හා වෙනත් දුර්වලතාවලට පිළියම් යොදා ශක්තිමත් කිරීමේ කටයුතු කිරීම.<br>* ඉහත කාර්යයන්ට අදාල වාර්තා ඉදිරිපත් කිරීම.<br><br>ඉහත කාර්යයන්ට අවශ්‍ය වන විදුම් යන්ත්‍ර, ජල පොම්ප හා වෙනත් උපකරණ ද ඒවාට අදාල ඩීසල් හා පෙට්‍රල් යන්ත්‍ර ක්‍රියාකරවීම, නඩත්තු කිරීම හා අලුත්වැඩියා කිරීම. |
| 3. | පර්යේෂණ සහකාර (සාමාන්‍ය) | 1) දැනට කෙරෙමින් පවතින හා ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන වාරිමාර්ග හා වෙනත් සංවර්ධන ව්‍යාපෘතින්හි ශක්‍යතා අධ්‍යයන කටයුතු සඳහා අවශ්‍ය වන පස් හා ජල සාම්පලවල භෞතික හා රසායන ගතිගුණ නිර්ණය සඳහා විශ්ලේෂණය කිරීම.<br><br>2) ද්‍රාවන හා ප්‍රතිකාරකයන් නිරවද්‍ය ලෙස පිළියෙල කිරීම. එදිනෙද විශ්ලේෂණ කාර්යයන්හිදී භාවිතා වන නවීන සූක්ෂම ඉලෙක්ට්‍රොනික් විද්‍යුත් හා විද්‍යුත් යාන්ත්‍රික උපකරණ නිසි ලෙස භාවිතා කිරීම, නිරවද්‍ය අංක ශෝධනය කිරීම හා මැනවින් නඩත්තු කිරීම, විශ්ලේෂණ මඟින් ලබා ගන්නා දත්තයන් සම්පාදනය කිරීම. |
| 4. | සිවිල් ඉංජිනේරුමය ද්‍රව්‍ය සමීක්ෂක | වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වාරි ව්‍යාපෘති ඉදිකිරීම් සඳහා අවශ්‍ය ඉංජිනේරුමය ද්‍රව්‍ය සමීක්ෂණ කටයුතු කිරීම, එම ක්ෂේත්‍රයේ ඉංජිනේරුමය ද්‍රව්‍ය සඳහා තත්ත්ව පාලන කටයුතුවල (පස් සහ කොන්ක්‍රීට් ද්‍රව්‍යයන්හි ගතිගුණ හා ශක්තීන් පිළිබඳ) නිරතවීම හා එම ප්‍රමිතීන් සහතික කිරීම.<br><br>රාජ්‍ය හා පුද්ගලික ආයතනවල ඉල්ලීම මත කෙරෙන ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය ඉංජිනේරුමය ද්‍රව්‍ය පර්යේෂණ කටයුතුවල නිරතවීම. |
| 5. | පාංශු ප්‍රස්ථාරක | * පාංශු සමීක්ෂණ හා පාංශු පාරිශීලන සිතියම් ඒකාබද්ධ කිරීම හා රාශිභූත කිරීම.<br>* ලබා දෙන්නා වූ දත්ත ආශ්‍රයෙන් සිතියම් ඇඳීම හා සිතියම් වර්ණ ගැන්වීම. |

| අනු අංකය | තනතුරු නාමය | පැවරෙන කාර්යයන් |
|---|---|---|
| | | * දළ පාංශු සිතියමට (Draft Soil map) පාංශු සිතියම (Final Soil map) පිළියෙළ කිරීම.<br>* ගුවන් ඡායාරූප ඉංජිනේරු මිනුම්පත් ආදිය ඇසුරෙන් ඉඩම් වර්ගීකරණ පාංශු හා ඉඩම් පරිහරණ ආදි සිතියම් පිළියෙල කිරීම, සිතියම් වර්ණ කිරීම හා ක්ෂේත්‍ර ඵලයන් ගණනය කිරීම, සිතියම් විශාල කර ඇඳීම සහ කුඩා කර ඇඳීම, විවිධ පස් පැතිකඩ හු දර්ශන ඇඳීම, මෙම අංශයෙන් නිකුත් කළ වාර්තාවලට රූප සටහන් ප්‍රස්තාර ආදිය ඇඳීම, වර්ණ සිතියම් නිෂ්පාදනයට අවශ්‍ය දෑ පිළියෙළ කිරීම.<br>* පරිගණක ආශ්‍රිත මෘදුකාංග භාවිතයෙන් පාංශු සිතියම් පිළියෙළ කිරීම. |
| 6. | ජල විද්‍යා සහකාර | ශ්‍රී ලංකාවේ දිවයින පුරා ජල ද්‍රෝණි හා ජලාශ ආශ්‍රිතව එක් රැස් කර ගන්නා වූ මූලික ජල විද්‍යාත්මක හා කාලගුණික දත්ත, විද්‍යාත්මක සිද්ධාන්ත ප්‍රායෝගිකව උපයෝගී කොට ගෙන ජල විද්‍යාත්මක අවශ්‍යතාවය සඳහා ගණනය කිරීම, විශ්ලේෂණ කිරීම, දත්ත පරිගණක ගත කිරීම, පරිගණක භාවිතයෙන් විශ්ලේෂණය කිරීම, දෛනික, මාසික, වාර්ෂික හා දිගුකාලීන වාර්තා පිළියෙල කිරීම හා පවත්වා ගෙන යාම, මහජනතාවට හා අදාළ ආයතනවලට එම තොරතුරු පිළියෙළ කිරීම.<br>* එක් රැස් කරගන්නා ජල විද්‍යාත්මක හා කාලගුණ දත්තවල නිරවද්‍යතාව ආරක්ෂා කිරීම හා ගුණාත්මකභාවය අධීක්ෂණය කිරීම සහ සහතික කර දත්ත බැංකුව නිරතුරුව පවත්වාගෙන යාම.<br>* ගංගාවල ගංවතුර මට්ටම් ඉහළ යාම නිර්ණය කිරීම සඳහා අවශ්‍ය දත්ත ලබාගෙන පරිගණකගත කිරීම හා නව ගණිතමය මාදිලි භාවිතයෙන් ගංවතුරට ලක් විය හැකි ප්‍රදේශ අධ්‍යයන කිරීම.<br>* ක්ෂේත්‍ර පරීක්ෂණ මගින් ගංවතුර හානි මට්ටම් හා එම හානිවලට ලක් විය හැකි ප්‍රදේශ මිනුම්ගත කිරීම හා සිතියම් ගත කිරීම.<br>* එම ප්‍රධාන ගංගාවල එවැනි ගංවතුරක් ඇතිවිය හැකි හෝ ඊට ආසන්න වන සෑම අවස්ථාවකදීම එම දත්ත නිරතුරුවම ලබා ගැනීම හා ඒ අනුව අනතුරු ඇඟවීම. |
| 7. | ජල විද්‍යා ක්ෂේත්‍ර සහකාර | ජල විද්‍යා අංශය මඟින් තෝරා ගත් ගංගා නිම්න සඳහා ජල විද්‍යා ක්ෂේත්‍ර මිනුම් ඒකක පවත්වා ගෙන යාම හා අවශ්‍ය වන කාලගුණ දත්ත, වර්ෂාපතනය, ගංගාවල ගලා යන ජල මට්ටම් සහ අවට ඇති වැව්වල ජල ධාරිතාවන්හි වෙනස්වීම් ආදිය පිළිබඳ දත්ත එක් රැස් කිරීම.<br>* එසේ ලබා ගන්නා ලද සියළුම ජල විද්‍යා හා කාලගුණ දත්ත පරීක්ෂා කර ලේඛන ගත කිරීම සඳහා මාසය අවසානයේදී ප්‍රධාන කාර්යාලයට ඉදිරිපත් කිරීම.<br>* ගංගාවල හා අතු ගංගාවල එම ජල මට්ටම් පවතින අවස්ථාවලදී ගලා යන ජල ධාරිතාවය මිනුම් ගැනීම.<br>ගංවතුර අනතුරක් ඇති විය හැකි අවස්ථාවලදී හෝ ඊට ආසන්න අවස්ථාවේදී ඒ සඳහා අනතුරු ඇඟවීම අවශ්‍ය වන ක්ෂේත්‍ර දත්ත නිරතුරුවම ප්‍රධාන කාර්යාලයට වාර්තා කිරීම, ප්‍රධාන ගංවතුර අවස්ථාවලදී එම වේලාවන් සමඟ ගංවතුර මට්ටම් වෙනස්වීම් සටහන් කර ගැනීම. |
| 8. | පර්යේෂණ සහකාර (ඉංජිනේරුමය ද්‍රව්‍ය) | වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වාරි ව්‍යාපෘතීන් ඉදිකිරීම් සඳහා අවශ්‍ය ඉංජිනේරුමය ද්‍රව්‍යවල යෝග්‍යතාව පිළිබඳව දී ඇති පිරිවිතරවලට අනුව පර්යේෂණ කටයුතුවල නිරත වීම හා පර්යේෂණාත්මක සාධක මත ප්‍රමිතීන් සහතික කිරීම, එම ක්ෂේත්‍රයේ ඉංජිනේරුමය ද්‍රව්‍ය සඳහා තත්ත්ව පාලන කටයුතුවල (පස් හා කොන්ක්‍රීට් ද්‍රව්‍යයන්හි ගතිගුණ හා ශක්තීන් පිළිබඳ) සේවයේ අවශ්‍යතාව මත නිරත වීම. |

| *අනු අංකය* | *තනතුරු නාමය* | *පැවරෙන කාර්යයන්* |
|---|---|---|
| | | රජයේ හා පුද්ගලික ආයතනවල ඉල්ලීම් මත කෙරෙන ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය ඉංජිනේරුමය ද්‍රව්‍ය පර්යේෂණ කටයුතුවල නිරත වීම හා එම ප්‍රමිතින් සහතික කිරීම. |
| 9. | පස් සමීක්ෂක | (1) දැනට කෙරෙමින් පවතින හා ඉදිරියේ දී ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන වාරිමාර්ග හා වෙනත් සංවර්ධන ව්‍යාපෘතීන්හි මෙම අංශය මගින් සිදු කරනු ලබන පස් සමීක්ෂණ කටයුතු ඉඩම් පරිහරණ කටයුතු සඳහා අවශ්‍ය වන ක්ෂේත්‍ර දත්ත හා අනෙකුත් දත්ත ලබා ගැනීම සහ අන්තර්ජාතික වර්ගීකරණයට අනුකූලව එක් එක් පස් වර්ග වර්ගීකරණය කිරීම.<br><br>(2) පස නිර්මාණය වීමේ සාධක (දේශගුණය, භූ විෂමතාව, භූවිද්‍යාත්මක කරුණු යනාදිය) සැලකිල්ලට ගනිමින් ඒ ඒ පාංශු ගණ හෝ ශ්‍රේණිවල පිහිටීම හා පැතිරීම තීරණය කිරීම.<br><br>(3) අන්තර්ජාතික සම්මතයන්ට අනුකූලව පාංශු පැතිකඩයන්හි සවිස්තරාත්මක සටහනක් සකස් කිරීම සඳහා අවශ්‍ය වන පරිද්දෙන් පාංශු නියදි ලබා ගැනීම. එම පාංශු නියැදි විශ්ලේෂණය සඳහා රසායනාගාරයට භාරදීම, එම විශ්ලේෂණ දත්ත හා ක්ෂේත්‍ර නිරීක්ෂණ දත්ත පදනම් කරගනිමින් අවසාන පාංශු සිතියම්හි නිරවද්‍යතාවය තහවුරු කරගැනීම සහ පාංශු යතුර පිළියෙල කර ගැනීම.<br><br>(4) අදාළ ප්‍රදේශවල ගුවන් ඡායාරූප ත්‍රිමානේක්ෂය උපයෝගී කරගනිමින් ගුවන් ඡායාරූප විශ්ලේෂණය කිරීම.<br><br>(5) දත්ත අවශ්‍ය වන තීව්‍රතාවය අනුව පාංශු සමීක්ෂණ කටයුතු සිදු කර ක්ෂේත්‍ර දත්ත ලබා ගැනීම, පස් පැතිකඩ අනුව පස් වර්ග හඳුනාගැනීම.<br><br>(6) ක්ෂේත්‍රයේ දී ලබා ගන්නා වූ නිරීක්ෂණ දත්ත මත දළ පාංශු සිතියම (Draft Soil Map) පිළියෙල කිරීම සහ පෙන්ටොග්‍රාෆ් යන්ත්‍රය භාවිත කරමින් අවශ්‍ය පරිමාණයට සකස් කිරීම.<br><br>(7) ක්ෂේත්‍රයේ දී ලබාගන්නා වූ නිරීක්ෂණ දත්ත හා අන්තර්ජාලය උපයෝගී කරගෙන ඉඩම් පරිහරණ සිතියම් පිළියෙල කිරීම.<br><br>(8) ජීපීඑස් (ජී. පී. එස්. - Global Position System) උපකරණ මගින් දත්ත ලබාගැනීම.<br><br>(9) පසේ ජල සන්නායකතාව පිළිබඳ දත්ත ලබාගැනීම.<br><br>(10) ක්ෂේත්‍රයේ දී ක්ෂේත්‍ර කම්කරු මුරකරු සහ රියැදුරන්ගේ පාලන කටයුතු (අධීක්ෂණ කටයුතු) සිදු කිරීම සහ ඔවුන්ගේ මූල්‍යමය රාජකාරි කටයුතු ඍජුවම සිදු කිරීම. |
| 10 | පර්යේෂණ සහකාර (ජල ශක්ති) | ජල ශක්ති අංශයේ ඉංජිනේරුවරුන්ගේ කටයුතුවලට සහය වීම, ජල ශක්ති අංශයට අදළ ඉදිකිරීම් වැඩවල සියළුම ක්ෂේත්‍ර කටයුතු උපකරණ, ද්‍රව්‍ය, කම්කරු පාලනය , ජල ශක්ති ආදර්ශන මෙහෙයවීම, ගොඩනැගිලි හා අනෙකුත් යටිතල පහසුකම් නඩත්තුව, ජල ශක්ති අංශයේ ඉදිකිරීම් වැඩවලට අදළ ඇස්තමේන්තු, සැලසුම්පත් සකස් කිරීම, දෙපාර්තමේන්තුවට අදළ සියළුම යාන්ත්‍රික හා ඉලෙක්ට්‍රොනික උපකරණ අළුත්වැඩියාවන්ට සම්බන්ධ වීම, එම උපකරණ මිලදී ගැනීමට |

| අනු. අංකය | තනතුරු නාමය | පැවරෙන කාර්යයන් |
|---|---|---|
| | | අදාළ පිරිවිතර සකස් කිරීම සහ ඒවා මිලදී ගැනීමේදී හා තත්ත්ව වාර්තා සකස් කිරීමේ දී අදාළ කටයුතුවලට සහාය වීම. |
| 11 | යාන්ත්‍රික මූලික | සුළු සේවකයන් පාලනය කිරීමේ දී සහ රථ වාහන, යන්ත්‍ර ආදිය සඳහා ලදුපත් පිළියෙල කිරීමේ දී යාන්ත්‍රික ඉංජිනේරුවරයාට සහය වීම, තාක්ෂණ සහායක (යාන්ත්‍රික) හෝ වැඩ ලිපිකරු සමග වැඩ ආරම්භ කිරීම, ගබඩා භාරකරු නොමැති අවස්ථාවල දී අළුත්වැඩියාව සඳහා පැමිණෙන අයිතමයන් තමන් භාරයට ගැනීම, අළුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය අමතර කොටස් ආයුධ සහ ද්‍රව්‍ය ආදිය ලබා ගැනීම, ගබඩා පොත් නඩත්තු කිරීම, ඇස්තමේන්තු පිළියෙල කිරීමේ දී යාන්ත්‍රික ඉංජිනේරුවරයාට සහාය වීම, අළුත්වැඩියා කිරීමෙන් පසු නිසි පරිදි ආපසු භාර දීම සහ අබලි අමතර කොටස් ද්‍රව්‍ය සහ භාණ්ඩ ආපසු ගබඩාවට භාරදීම කරන ලද අළුත්වැඩියාවන් ලොග් පොත්වල ඇතුළත් කිරීම, තාක්ෂණ සහායක (යාන්ත්‍රික) හෝ පිරිවැය ලිපිකරු සමග මුළු පිරිවැය (බිල්පත්) පිළියෙල කිරීම, පාවිච්චි කරන ලද අමතර කොටස් ඉන්ධන ලිහිසි තෙල් සහ අනෙකුත් දේ වෙනුවෙන් ද්‍රව්‍ය වාර්තාව ඉදිරිපත් කිරීම.<br><br>අළුත්වැඩියාවලට යාන්ත්‍රික වැඩපලට රැගෙන එන යන්ත්‍ර හා වාහන, ගබඩා භාරකරුගෙන් යාන්ත්‍රික වැඩපලට භාරගෙන, අළුත්වැඩියාව නිම වීමෙන් පසු නැවත ගබඩා භාරකරු වෙත භාර දීම. |

2.0 බඳවා ගැනීමේ ක්‍රමය :

2.1 වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින් පවත්වනු ලබන ලිඛිත තරග විභාගයක ප්‍රතිඵල අනුව පිරවීමට අපේක්ෂිත පුරප්පාඩු සංඛ්‍යාවට සමාන අයදුම්කරුවන් සංඛ්‍යාවක් විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව, සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ.

2.2 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය අයදුම්කරුවන්ගේ ශාරීරික යෝග්‍යතාවය හා සහතික පත්‍ර පරීක්ෂා කර බැලීම සඳහා වන අතර, සම්මුඛ පරීක්ෂණයට ලකුණු ලබා දෙනු නොලැබේ.

3.0 වැටුප් පරිමාණය :

පුහුණු කිරීමේ ශ්‍රේණිය - රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව 2017.01.01 දිනට පළමු වසර පුහුණුව සඳහා රු. 18,728/- ක මාසික දීමනාවක් හා රු. 7,110/- ක ගැලපුම් දීමනාවක් හිමි වේ.

III වන ශ්‍රේණිය - රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හි උපලේඛන I අනුව මෙම තනතුරට අදළ මාසික වැටුප් පරිමාණය රු. 31,040 - 10x445 - 11x660 - 10x730 - 10x750 - රු. 57,550/- වේ. (MN3-2016) එම චක්‍රලේඛණයේ උපලේඛන II අනුව 2017.01.01 දිනට රු. 21,419/-ක මූලික වැටුපක් හා රු. 6,587/- ක ගැලපුම් දීමනාවක් හිමි වේ.

4.0 සේවා ගණය/සේවා ගණ - අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික/ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික අධිපන්තිය

4.1 ශ්‍රේණි - III ශ්‍රේණිය
II ශ්‍රේණිය
I ශ්‍රේණිය
විශේෂ ශ්‍රේණිය

4.2 තනතුරෙහි ස්වභාවය - ස්ථිර විශ්‍රාම වැටුප් සහිත

5.0 සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :-

5.1 පුහුණු කිරීමේ ශ්‍රේණියට ඇතුළත් කර ගනු ලබන අයදුම්කරුවන් අදාළ පුහුණු කාලසීමාව සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් අනතුරුව වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් පවත්වනු ලබන විභාගය සමත් බවට නිකුත් කරනු ලබන සහතිකය ඉදිරිපත් කිරීමෙන් පසු සේවයේ III ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

5.2 පුහුණුව අවසානයේ පවත්වනු ලබන විභාගය සමත් වීමට අපොහොසත් වන ආධුනිකයින් වෙතොත් ඔවුනට මාස 06 කට නොවැඩි කාලයක් සඳහා සිය පුහුණු කාලය දීර්ඝ කරවා ගැනීමට අවස්ථාව ඇත. එසේ දීර්ඝ කරනු ලබන කාලසීමාව අවසානයේ නැවත පවත්වනු ලබන විභාගය අසමත් වන ආධුනිකයන්ගේ සේවයේ අවසන් කරනු ලැබේ.

5.3 III ශ්‍රේණියේ පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත් වේ. III වන ශ්‍රේණියට බඳවා ගෙන වසර 03 ක් ඇතුළත පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

5.4 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 අනුව තනතුරට බැඳී වසර 5ක් ඇතුළත සේවාවට බැඳුණු භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව අදාළ ප්‍රවීනතාවය ලබා ගත යුතු ය.

5.5 රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යපරිපාටික රීතිවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

5.6 තෝරාගනු ලබන අයදුම්කරුවන් දිවයිනේ දුෂ්කර ප්‍රදේශවල පිහිටි වාරිමාර්ග ක්ෂේත්‍රයේ වැඩබිම්වල සේවයේ යෙදීමට හැකියාව තිබිය යුතු ය.

6.0 වයස් සීමාව:

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අවම වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර, උපරිම වයස අවුරුදු 30 ට නොවැඩි විය යුතු ය.

7.0 අවශ්‍ය සුදුසුකම්:

7.1 අධ්‍යාපන සුදුසුකම්:

7.1 (අ) සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයයන් හය කින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම;

*සහ*

7.1 (ආ) සැලසුම් ශිල්පි, විදුම් සහකාර, සිවිල් ඉංජිනේරුමය ද්‍රව්‍ය සමීක්ෂක, පාංශු ප්‍රස්ථාරක, ජල විද්‍යා සහකාර, ජල විද්‍යා ක්ෂේත්‍ර සහකාර, පර්යේෂණ සහකාර (ඉංජිනේරුමය ද්‍රව්‍ය), පර්යේෂණ සහකාර (ජල ශක්ති), යාන්ත්‍රික මූලික යන තනතුරු සඳහා
අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී ව්‍යවහාරික ගණිතය/ශුද්ධ ගණිතය/සංයුක්ත ගණිතය සහ භෞතික විද්‍යාව සහිතව විද්‍යා විෂයන් තුනකින් (03) එකවර සමත්ව තිබීම.

7.1 (ඇ) *පර්යේෂණ සහකාර (සාමාන්‍ය) සහ පස් සමීක්ෂක තනතුරු සඳහා*
අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ තවත් එක් විද්‍යා හෝ ගණිත විෂයයක් සහිතව විද්‍යා විෂයයන් තුනකින් (03) එකවර සමත්ව තිබීම.

7.2 වෘත්තීය සුදුසුකම්
සැලසුම් ශිල්පි තනතුර සහ යාන්ත්‍රික මූලික තනතුර සඳහා ඉහත 7.1 හි සඳහන් අධ්‍යාපන සුදුසුකම්වලට අමතරව පහත සඳහන් වෘත්තීය සුදුසුකම් තිබිය යුතු ය.

**සැලසුම් ශිල්පි**
තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික විද්‍යාලයක සැලසුම් ශිල්පය පිළිබඳ එක් අවුරුදු පූර්ණ කාලීන පුහුණු පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාළ සහතිකය ලබා තිබීම.

යාන්ත්‍රික මූලික:

(i) මොරටුව විශ්ව විද්‍යාලය හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික තාක්ෂණික ඩිප්ලෝමාව;

*හෝ*

(ii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් පිරිනමනු ලබන ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමාව,

*හෝ*

(iii) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු ඩිප්ලෝමාව

*හෝ*

(iv) ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණික ඩිප්ලෝමාව ලබා තිබීම;

*හෝ*

(v) ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ I වන කොටස සාර්ථකව සම්පූර්ණ කිරීම;

*හෝ*

(vi) රැකියා ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම;

*හෝ*

(vii) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

7.3 කායික සුදුසුකම් :

සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.4 වෙනත් සුදුසුකම්:

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.
(ii) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
(iii) යම් ආගමික නිකායක පැවිදිවරයක් දරණ කිසිදු තැනැත්තෙකු මෙම විභාගය සඳහා පෙනී සිටීමට සුදුසුකම් නොලබයි.
(iv) සේවයට බඳවා ගැනීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු අදළ සියළු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

8.0 සාවද්‍ය තොරතුරු සැපයීම:

මෙම විභාගයට ඉදිරිපත් වීම සඳහා ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව හෝ බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදල ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

9.0 විභාග පටිපාටිය:

විභාගය විෂයන් දෙකකින් යුත් ලිඛිත පරීක්ෂණයකි. මෙම විභාගය සිංහල සහ දෙමළ මාධ්‍යවලින් පැවැත්වෙන අතර ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| ප්‍රශ්න පත්‍රය/විෂය ක්ෂේත්‍රය | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 |
| 2. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පැය 03 | 100 | 40 |

9.1 විභාගය සඳහා වන විෂය නිර්දේශයඃ

1. බුද්ධි පරීක්ෂණය ඃ

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූල භාවයත් සිතීමේ විශ්ලේෂණ තත්ත්වයත් තීරණය කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්ත වේ. |

2. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය ඃ

- සැලසුම් ශිල්පී තනතුර සඳහා -

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | දෙන ලද නිර්මිතයක ප්‍රමාණය ගණනය කිරීම සහ ඉදිකිරීම් ද්‍රව්‍යවල ගුණාත්මක ස්වභාවය පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම සහ ඇඳීමේ මූල ධර්ම පාවිච්චි කර දෙන ලද සටහන් අනුව වස්තුවක හෝ කොටසක හරස්කඩක් සහ පෙර හෝ පසු පෙනුමක් ඇඳීම. |

- සිවිල් ඉංජිනේරුමය ද්‍රව්‍ය සමීක්ෂක/විදුම් සහකාර/පර්යේෂණ සහකාර (ඉංජිනේරුමය ද්‍රව්‍ය)/පර්යේෂණ සහකාර (ජලශක්ති)/පාංශු ප්‍රස්ථාරක තනතුරු සඳහා-

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | වීජ ගණිතය, ජ්‍යාමිතිය, ත්‍රිකෝණමිතිය, ද්‍රව සහ ද්‍රවල භෞතික ගුණ, ද්‍රවස්ථිති විද්‍යාව, මිනුම් ඒකක, පරිමාණ සිතියම් කියවීම, විද්‍යාත්මක ගණනය කිරීම ආදී විෂයන් පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම සඳහා වූ ප්‍රශ්න පත්‍රය පිළියෙල කරනු ලැබේ. |

- පස් සමීක්ෂක/පර්යේෂණ සහකාර(සාමාන්‍ය) තනතුර සඳහා -

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | I කොටස (භෞතික විද්‍යාව)<br>(a) ආලෝකය<br>(b) තාපය<br>(c) යන්ත්‍ර විද්‍යාව<br>(d) විද්‍යුතය හා චුම්භකත්වය<br><br>II කොටස (රසායන විද්‍යාව)<br><br>(a) කාබනික රසායනය<br>(b) ප්‍රමාණාත්මක හා ගුණාත්මක විශ්ලේෂණය<br>(c) අකාබනික රසායනය<br>(d) සාමාන්‍ය රසායන විද්‍යාව |

- ජල විද්‍යා ක්ෂේත්‍ර සහකාර/ජල විද්‍යා සහකාර තනතුර සඳහා

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | ඛණ්ඩාංක ජ්‍යාමිතිය, ගති විද්‍යාව, ස්ථිති විද්‍යාව, ත්‍රිකෝණමිතිය, ද්‍රවස්ථිති විද්‍යාව, සංඛ්‍යානය, යාන්ත්‍ර විද්‍යාව, ආලෝකය (වර්තනය සහ පරාවර්තනය පිළිබඳ නියමයන්) තාපය, ආද්‍රතාවය, විදුලිය, ඉලෙක්ට්‍රොනික විද්‍යාව ආදී විෂයයන් පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම සඳහා වූ ප්‍රශ්න වලින් මෙම ප්‍රශ්න පත්‍රය සමන්විත වේ. |

- යාන්ත්‍රික මූලික තනතුර සඳහා :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | ඇඳීමේ මූලධර්ම පාවිච්චි කරගෙන දෙන ලද රූපසටහනක් අනුව යන්ත්‍රයක හෝ කොටසක හරස්කඩක් හෝ පෙර හෝ පසු පෙනීමක් ඇඳීම සහ භෞතික විද්‍යාව, යාන්ත්‍රික විද්‍යාව හා ව්‍යවහාරික ගණිතය යන විෂයයන් පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කිරීම සඳහා ප්‍රශ්න පත්‍ර පිළියෙල කරනු ලැබේ. |

9.2 මෙම විභාගය 2017 අප්‍රේල් මස කොළඹ නගරය තුළදී පමණක් පැවැත්වෙනවා ඇත. මෙම විභාගය කල් දැමීම හෝ අවලංගු කිරීම පිළිබඳ අවසන් තීරණය වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් සතු වන්නේ ය.

10.0 අයදුම්පත් සකස් කිරීම හා ඉදිරිපත් කිරීම :

10.1 මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව සෙ.මී. 21 x 29 (ඒ4) ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් තමන් විසින් ඉල්ලුම්පත්‍රය සකස් කරගත යුතුය.අංක 1.0 සිට 6.0 දක්වා ශීර්ෂ 01 පිටුවේ ද, අංක 07.0 සිට 11.0 දක්වා 02 පිටුවේ ද අංක 12.0 සිට 15.0 දක්වා 03 පිටුවේ ද, අංක 16, 04 පිටුවේද ඇතුළත් වන පරිදි ඉල්ලුම් පත්‍රය සැකසිය යුතුය.

10.2 දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු ඉල්ලුම්කරුවන් අයදුම්පත් තම දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ද රාජ්‍ය සංස්ථා පළාත් පාලන ආයතන ආදියේ සේවයේ නියුතු වූවන් සිය ආයතන ප්‍රධානීන් මගින් ද නියමිත දිනට හෝ ඊට පෙර ඉදිරිපත් කළ යුතු වේ.

10.3 අයදුම්පත් සකස් කළ යුත්තේ තමා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යයෙන් ය.

10.4 නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10.5 අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. තැපෑලේදී අස්ථාන ගත වන ඉල්ලුම්පත් සම්බන්ධව කෙරෙන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

10.6 තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

10.7 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඔබ ඉල්ලුම් කරන තනතුර අනුව " වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ ......................................................තනතුරට බඳවා ගැනීම" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය.

10.8 අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ *ගැසට් කළ* තනතුරක් දරන නිලධාරයෙකු හෝ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 ශ්‍රේණිගත කිරීම අනුව තෘතීය හෝ ජ්‍යෙෂ්ඨ මට්ටමේ රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකුගේ හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

10.9 මෙම පුරප්පාඩු පිරවීම, නොපිරවීම හෝ පුරප්පාඩුවලින් කොටසක් පිරවීම හා අනෙකුත් සියලුම කරුණු පිළිබඳව අවසන් තීරණය වාරිමාර්ග අධ්‍යක්ෂක ජනරාල් සතු වන්නේ ය.

11.0 *අයදුම්පත යොමු කිරීම* :
සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2017 පෙබරවාරි 28 වැනි දින හෝ ඊට පෙර පහත දක්වෙන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

වාරිමාර්ග අධ්‍යක්ෂක ජෙනරාල්,
වාරිමාර්ග දෙපාර්තමේන්තුව,
අංක 230, බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

12.0 *විභාගයට පෙනී සිටීම* :
විභාගයට පෙනී සිටින අපේක්ෂකයෙකු විභාග මධ්‍යස්ථානයේ විභාග ශාලාධිපතිට තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කල යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී ම විභාගයට පෙනී සිටිය යුතුය.

13.0 *අපේක්ෂකයාගේ අනන්‍යතාවය* :
විභාග ශාලාවේදී තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමට පත්වන අයුරින් අයදුම්කරුවන් තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ලේඛන පිළිගනු ඇත.

(*අ*) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත.

(*ආ*) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

14.0 මෙම *ගැසට්* නිවේදනයේ සිංහල,දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේ ය.

ඉංජි. එස්.එස්.එල්.වීරසිංහ,
වාරිමාර්ග අධ්‍යක්ෂක ජෙනරාල්.

2017 ජනවාරි මස 09 වැනි දින,
වාරිමාර්ග දෙපාර්තමේන්තුව,
කොළඹ 07.

**ආදර්ශ අයදුම් පත්‍රය**

වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙහි පුරප්පාඩුව පවත්නා ශ්‍රී ලංකා තාක්ෂණ සේවයෙහි තනතුරුවලට බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විවෘත තරග විභාගය - 2016

[ ]

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි)

1.0 විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය :

සිංහල - 1
දෙමළ - 2 [ ]
(අදාල කොටුව තුළ ලියන්න)

2.0 අයදුම්කරනු ලබන තනතුරු නාමය :————.
(එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.)

3.0 මුලකුරු සමඟ නම (මුලකුරු අගට යොදා) :————. (මයා/මිය/මෙනවිය)
සිංහලෙන් / දෙමළෙන් :————.

ඉංග්‍රීසි (කැපිටල් අකුරින්) :————.
(උදා. PERERA, A.B. C)

3.1 සම්පූර්ණ නම :
සිංහලෙන් / දෙමළෙන් :————.
ඉංග්‍රීසි (කැපිටල් අකුරින්) :————.

4.0 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

5.0 ස්ත්‍රී / පුරුෂ භාවය (අදාල කොටුව තුළ ලියන්න)
පුරුෂ - M
ස්ත්‍රී - F ☐

6.0 සජීර ලිපිනය : (පැහැදිලි අකුරෙන්)
සිංහලෙන් / දෙමළෙන් :————.
ඉංග්‍රීසි (කැපිටල් අකුරින්) :————.

6.1 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :
සිංහලෙන් / දෙමළෙන් :————.
ඉංග්‍රීසි (කැපිටල් අකුරින්) :————.

7.0 දුරකථන අංකය : ස්ථාවර :————. ජංගම :————.

8.0 පදිංචිය :
8.1 පදිංචි දිස්ත්‍රික්කය :————.
8.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.

9.0 විවාහක / අවිවාහක බව :

අවිවාහක - 1 විවාහක - 2 ☐

10.0 උපන් දිනය :

වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

10.1 ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට (2017.02.28 දිනට) වයස :

අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

11.0 අධ්‍යාපන සුදුසුකම් :

11.1 අ.පො.ස. (සා/පෙළ) විභාගය පිළිබඳ විස්තර :
(i) විභාගයේ වර්ෂය හා මාසය :————.
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිඵල :

| විෂය | ශ්‍රේණිය | විෂය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

11.2 අ.පො.ස (උ/පෙළ) විභාගය පිළිබඳ විස්තර :

i. විභාගයේ වර්ෂය හා මාසය :————.

ii. විභාග අංකය :————.

iii. ප්‍රතිඵල :

| විෂය | ශ්‍රේණිය |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |
| 5. | |

12.0 වෘත්තීය සුදුසුකම් :

| හදරා ඇති පාඨමාලාව | පිරිනමනු ලැබූ ආයතනය | හදරණ ලද කාල සීමාව | සහතිකපත් අංකය හා වලංගු දිනය |
|---|---|---|---|
| | | | |

13.0 ඔබ කවරදක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?

(අදළ කොටුවේ X ලකුණ යොදන්න)

ඔව් ☐ නැත ☐

13.1 ''ඔව්'' නම් විස්තර සඳහන් කරන්න. :————.

14.0 අයදුම්කරුගේ සහතිකය :

................................... වන මම මෙහි සඳහන් කරන සියලුම කරුණු සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මම රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබ හෝ සානුකම්පිත විකල්පයක් වශයෙන් අකාර්යක්ෂමතාවය මත සේවයෙන් විශ්‍රාම ගන්වා හෝ නොමැති බවත්, තනතුර අතහැර ගිය අයෙකු සේ සලකා නොමැති බවත් සහතික කරමි. මෙහි ඇතුළත් කරුණු කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ මා තෝරා ගැනීමට පෙර හෙළි වුවහොත් සේවයට බඳවා ගැනීමට නුසුදුස්සෙකු කිරීමට යටත් වන බවත්, තෝරා ගැනීමෙන් අනතුරුව එවැනි තත්වයක් අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් මම දනිමි. මා මෙම තනතුරට තෝරා පත් කර ගනු ලැබුවහොත් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක වාරිමාර්ග ක්ෂේත්‍රයේ වැඩ බිම්වල රාජකාරි කිරීමට එකඟ වෙමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

15.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ............................................... මයා/මිය/මෙනවිය, මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය ........................ වැනි දින මා ඉදිරිපිටදී ඉහත 14 ඡේදය යටතේ අත්සන් තබන ලද බවත් සහතික කරමි.

————,
සහතික කරන නිලධාරියාගේ අත්සන

දිනය :————.

සහතික කරන නිලධාරියාගේ නම :————.

තනතුර :————.

ලිපිනය :————.

(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

16.0 දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ/ආයතන ප්‍රධානියාගේ සහතිකය : (දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.) ..................... මයා/මිය/මෙනවිය ..................... සේවයේ නියුතු ..................... තනතුර දරන නිලධාරියෙකු බවත්, ඔහු/ඇය ඉහත සපයා ඇති තොරතුරු නිවැරදි බවත් සහතික කරමි. මෙම තනතුර සඳහා ඔහු/ඇය තෝරාගනු ලැබුවහොත්, ........................ සේවයෙන් ඔහු/ඇය මුදා හැරිය හැකි/නොහැකි බවත් වැඩිදුරටත් දන්වා සිටිමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ/ආයතන
ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව.

දිනය :————.

01-851

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.